*2016 මැයි මස 10 අඟහරුවාදා දින*
*2016 மே மாதம் 10 ஆம் திகதி வியாழக்கிழமை*
***Thursday 10th May 2016***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------

සියළු දෙනාටම සුභ උදෑසනක් වේවා. ගරු අමාත්‍යතුමනි, නියෝජ්‍ය සභාපතිතුමා ඒවගේම ගරු විපක්ෂනායකතුමා, ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සියළු දෙනාගෙන්ම අවසරයි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා න්‍යාය පත්‍රානුකූලව පළමුව තිබෙන්නේ තිබෙන්නේ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම්දීම :**

මේ යටතේ කිසිවක් නැහැ.

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**ගරු සභාපතිතුමාගේ නිවේදන :**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා, ඒවගේම ගරු මන්ත්‍රී උපුල් ශ්‍යාමල් බණ්ඩාර අවසරය ඉල්ලා ලිපි ඉදිරිපත් කරලා තියෙනවා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

නිවාඩු ලබාදීම සුදුසු යැයි යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------

හොඳයි මෙම ගරු සභාවේ ඒ මැති ඇමතිතුමන්ලා සඳහා නිවාඩු ලබාදීම සුදුසු යැයි අනුමත කරනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම :**

මේ යටතේ ආරියවංශ බාලසූරිය මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට පිළිතුරු එවා තිබෙනවා. අපි ඒ පිළිතුර ලැබීමට සලස්වනවා.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම :**

මේ යටතේ කිසිවක් නෑ.

**පෙත්සම් :**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**ප්‍රශ්න :**

මීළඟට ප්‍රශ්න යටතේ ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2015/29 දරණ ප්‍රශ්නය සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් විමසීම් කරලා තියෙන්නේ. අද ප්‍රධාන අමාත්‍යතුමා ආවේ නැහැ. එතුමා විසින් ප්‍රශ්නය සඳහා සභාවේ කල් ඉල්ලා තිබෙනවා.

මීළඟට ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2016/03 දරණ ප්‍රශ්නය සඳහා ගරු අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ ඇමතිතුමාගේ පිළිතුරු ඉල්ලා තිබෙන්නේ. එතුමා සභාවේ නෑ.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

---

ගරු සභාපතිතුමනි මට පුද්ගලික ප්‍රශ්නයක් තියෙනවා. මේ ප්‍රශ්න ඇසීම සම්බන්ධව. කාර්යය පරිපාටි රීති දර්ශකය අනුව එක මන්ත්‍රීවරයෙකුට අහන්න පුළුවන් ප්‍රශ්න තුනයි. ඒවගේම ප්‍රශ්න දහයක් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්. මම ගිය සභා වාරය වෙන කොට න්‍යාය පත්‍රයේ මාස කීපයක්ම මගේ ප්‍රශ්න තුනක් තිබුණා. පිළිතුරු නොලැබීම තුළ මට වෙනත් ප්‍රශ්නයට යාමට අවසථාව නෑ. මම ඉල්ලීමක් කළ ඔබතුමා නෙමෙයි නියෝජ්‍ය සභාපතිතුමා හිටියේ. එක් මන්ත්‍රීවරයෙකුට තියෙන සීමාව ඉක්මවලා අර දහය සීමාව තුළටවත් අපේ ප්‍රශ්න ටික ඉදිරිපත් කර ගන්න පුළුවන් නම්.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

පස්සෙ පෙළ ගැහිලා තියෙන ඉතුරු ටික.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
------------------------------------------------------------

නැත්නම් අපිට අසාධාරණයක් වෙනවා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------

හොඳයි ගරු මන්ත්‍රීතුමා ඔබතුමා විසින් යෝජනා කරන ලද යෝජනාව මට නියෝජ්‍ය සභාපතිතුමා විසින් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ පිළිබඳව අද සභා කටයුතු කාරක සභාවේ සාකච්ඡා කරලා ඔබතුමාට අවශ්‍ය සාධාරණයක් විසඳුමක් ලබාදීමට කටයුතු කරනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා ඔබතුමාගෙනුත් ප්‍රශ්නය අහලා තිබුණේ. ඒ අවස්ථාවේ තමයි ඔබතුමා සභාවට පැමිණියේ.

***ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය***
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய***
*Hon. Minister Bhanu Munipriya*
--------------------------------------------------------------

පළවෙනි ප්‍රශ්නයට ස්ථාන මාරු කර ඇත. අක්‍රමිකතාවයක් සිදුව නැත. තුන්වෙනි එකට එය මම දන්නවා ඔව්. හතර වෙනි ප්‍රශ්නය එවැනි ක්‍රමයක් නැත. ඒක ඔබතුමාත් දන්නවා. පස්වෙනි ප්‍රශ්නයට ඔව්. හය වෙනි ප්‍රශ්නයට අදාල නොවේ.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
------------------------------------------------------------

අසාධාරණයට ලක් වෙච්චි අයම විදුහලේ පමණක් රැඳී සිටිමින් රජයෙන් පඩි ලබමින් සිටින බව ඔබතුමා දන්නෙහිද? ස්ථාන මාරුවක් කරලා තියෙනවා.

මම මීට ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නයට ඔබතුමා උත්තරයක් දුන්නා. වර්ෂයක කාලයක් ඒ විදුල්පතිවරයා වහපු ඉස්කෝලයක රැඳී ඉන්න ඕනේ කියලා. එතකොට දැන් මාරු කරලා තියෙනවා නම් ඔබතුමා එදා දීපු පිළිතුර අනුව ගිය අවුරුද්දේ අට වෙනි මාසයේ විතර මට මතක. ලිඛිතව ලැබුණේ නැහැ. එහෙම නම් වර්ෂය ඉක්මවන්න ඉස්සෙල්ලා මාරු කරලා තියෙනවා එහෙම නම් ඒකත් චක්‍ර ලේඛණය උල්ලංඝණය කිරීමක්. මම කියනවා එහෙම නැහැ. ආයතන සංග්‍රහය හැටියට වහලා තියෙන ඉස්කෝලයක් නැවත වහන්න පෙර විදුහල්පතිවරයා ඉන්න ඕනේ. මේ අදාල විදුහල්පතිරවරයා 2015.03.16 වෙනි දින භාණ්ඩ භාර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවෙන් ඇවිල්ලා තියෙනවා. විදුහල්පතිවරයා භාර දීලා නෑ. නැවත 2015.03.24 වෙනිදා ගිහිල්ලා තියෙනවා මේ විදුහල්පතිවරයාගෙන් භාණ්ඩ ගන්න. පොදු 66 ලේඛණය සම්පූර්ණ කරලා ලේඛණය විදුහල්පතිවරයා භාර දීලා නැති නිසා ඒ භාණ්ඩ භාර ගැනීමට දෙපාර්තමේන්තු නිළධාරීන්ට හැකියාවක් ලැබිලා නෑ. ඒ කියන්නේ විදුහල්පතිවරයා අකාරක්ෂමව රෙගුලාසි අනුව වැඩ නොකරන විදුහල්පතිවරයෙක්. එතකොට එහෙම කරපු විදුහල්පතිවරයෙකුට දැන් වර්තමානයේ ඒ විදුහල්පතිවරයා දාන්න

හදලා තියෙනවා කුඹුරුගම විද්‍යාලයේ විදුහල්පතිවරයාට. එතකොට පින්නකන්ද විද්‍යාලයත් මම කියපු විදිහට ගොඩනැගිල්ල කඩලා ඉවත් කරලා ඒක ඔබතුමාම පිළිගත්තා වැරැද්දක් කියලා. ඒ ගොඩනැගිල්ල කඩපු එක කියලා. ඒ වරැද්ද කරපු විදුහල්පතිවරයා කෝන්පිටිය විද්‍යාලයට මාරු කරලා ඊට පස්සේ කෝන්පිටිය විද්‍යාලය වහන තත්ත්වයට පත් කරලා වැහුවට පස්සේත් 2015 තුන්වෙනි මාසයේ ඉඳලා අද වෙනකන් රජයෙන් පඩි ගන්නවා කිසිම ඉස්කෝලයකට වැඩක් කරන්න යන්නේ නෑ. එයා පාසැලේ ඉඳගෙන වෙන වෙන බිස්නස් කරගෙන ඉන්නවා. ඒ පුද්ගලයා කුඹුරුගමුවට හෝ පනාවල විද්‍යාලයට විදුහල්පතිවරයෙක් කරලා ඇරියොත් මොන වගේ තත්ත්වයක් මතු වෙයිද.

දෙවෙනි කාරණාව මේ විදුහල්පතිවරයාට වැටුප හැටියට අතට හම්බ වෙන්නේ ගරු සභාපතිතුමනි රු.6000/- ක් විතර. අනිත් ඒවා ඔක්කෝම ණය වලට කැපෙනවා. එහෙම නම් සාමානායෙන් රජයෙන් පඩි ලබන පුද්ගලයෙකුගේ ණය වශයෙන් කපා ගන්න පුළුවන් වෙන්නේ තුනෙන් එකක් වගේ ප්‍රමාණයක් මං හිතන්නේ ඒ අයට ජීවත් වෙන් අවශ්‍යයි. එහෙම නම් යම්කිසි නිළධාරී කණ්ඩායමක් මේ අයගේ ණය සීමාව ඉක්මවලා ණය ගන්න පුළුවන් විදිහට අනුමැතියක් දීලා තියෙනවා. කවුරු හරි නිළධාරී කණ්ඩායමක්. ඒ නිසා තමයි ඒ අයට ඒවගේ ණය ප්‍රමාණයක් ගන්න පුළුවන් වුණේ. දැන් ඒ පුද්ගලයාට අතට ඉතුරු වෙන්නේ රු.6000/- ක් වගේ ප්‍රමාණයක්. ඒ නිසා එවැනි තත්ත්වයක තවත් විද්‍යාලයක විදුහල්පතිවරයෙක් කරලා දැම්මොත් මං හිතන්නේ පනාවල විද්‍යාලයේ ගුරුවරුන්ගේ සහ දෙමව්පියන්ගේ කුකුසක් මතු වෙලා තියෙනවා. ඒ විද්‍යාලයට එන්න ඒ විදුහල්පතිවරයා හදනවා කියලා. හැබැයි ඒ විද්‍යාලයේ හෝ ඒ විද්‍යාලයේ දෙමව්පියෝ පාරට බැහැලා කැගහන එක නවත්තන්න බැරි වෙයි එවැනි දෙයක් සිද්ධ වුණොත්. මම කියන්නේ මේ අය ශ්‍රේණිධාරී විදුහල්පතිවරයෙක්. දෙවෙනි ශ්‍රේණිය තියෙන විදුහල්පතිවරයෙක්. මේ පුද්ගලයාට විනය ක්‍රියා මාර්ගයක් ගන්න. දැනට පාසැලකට මාරු කිරීම නෙමෙයි කළ යුත්තේ.

***ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය***
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய***
*Hon. Minister Bhanu Munipriya*

-----------------------------------------------------------

මේ පිළිබඳව පරීක්ෂණයක් තිබෙනවා. ඒ පරීක්ෂණය අතරතුර තමයි පාසැල වහපුවහම පාසැලට අවුරුද්දක් ඒ ප්‍රධානියා හෝ වෙන කෙනෙක් ඉන්න ඕනේ. මොකද පාසැල වැහුවා කියලා නෑ. පාසැලට ඊළඟ අවුරුද්ද වෙන කොට ළමයි හතර පස් දෙනෙක් ඒ පළවෙනි ශ්‍රේණියට ආවොත් කියලා ඒ ප්‍රශ්නය මත. පාසැලට එන දරුවාටත් අධ්‍යාපන අවශ්‍යතා ලබාදීම අපේ වගකීමක්නේ. ඒක හරි. ඔබතුමා කියන කාරණා ඔක්කෝම එකඟයි. පරීක්ෂණය පවතිනවා. ඔහු නැවත විදුහල්පතිවරයෙක් ලෙස යන්නේ නෑ. ස්ථාන මාරු කළත්. ඒවගේම අපි අතනට අධීක්ෂණයට නිළධාරියෙක් දාලා තියෙනවා. ඉතුරු මාස කීපය බලන්න. අනතුරුව ඒක ප්‍රාදේශීය ලේකම්තුමාට අපි භාර දෙනවා ගොඩනැගිල්ලත් එක්ක. එහෙමයි වෙන්නේ. ඔබතුමා වාර්තා කරන්න.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
-----------------------------------------------------------

කොන්පිටිය විද්‍යාලය ආරම්භ කරන්න ඕනේ. මේ අවුරුද්දේත් ළමයි හිටියා. ඒ හිටිය ළමයින්ගෙන් කොටසක් වේරහැර විද්‍යාලයට යන්න පුළුවන් කොටස ගියා. මාර්ග දුෂ්කරතාවයක් නිසා. දැන් ඉතුරු වෙච්ච ළමයි ටික ගොඩකවෙල ප්‍රාථමිකයට පයින් ඇවිල්ලා එතන ඉඳලා පයින් වේරහැරට යන්න ඕනේ. මොකද මාර්ගයක් නෑ. ඒක තමයි මම අහලා තියෙන්නේ මේ ළමයින්ට මොකද කරන්නේ කියලා. අනිවාර්යයෙන් මේ පාසැල පටන් ගත්තොත් මේ විදුහල්පතිවරයාත් එක්ක මේක කරන්න බෑ. පුළුවන්කම තියෙනවා නම් මෙයා පටන් ගෙන යනවානේ. වෙන විදුහල්පතිවරයෙක් දාලා ආරම්භ කරන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------

හොඳයි ස්තූතියි ගරු අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා විසින්ම ඉදිරිපත් කර ඇති 6/1/2016/04 දරණ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් විමසීම් කරලා තියෙන්නේ. එතුමා අද නිවාඩු ලබාගෙන තියෙන්නේ. එතුමා අද සභාවේ නැහැ. ඒ සඳහා කල් ඉල්ලා තිබෙනවා.

මීළඟට ගරු විපක්ෂනායක ඩබ්.සෝමදාස මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2016/06 ප්‍රශ්නය ගරු පළාත් මාර්ග සංවර්ධන ගරු අමාත්‍යතුමාගෙන් විමසීම් කරලා තියෙන්නේ. ඒ සඳහා පිළිතුරු ලැබී තිබෙනවා. ගරු විපක්ෂනායකතුමා අපි ඔබතුමාට පිළිතුරු ලබාදීමට කටයුතු සලස්වා තිබෙනවා.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ :**

කිසිවක් ලැබී නැහැ.

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

කිසිවක් ලැබී නැහැ.

**ශෝක ප්‍රකාශ යෝජනා :**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා :**

කිසිවක් නැහැ.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය යෝජනා:**

මේ යටතේ කිසිවක් නැහැ.

**පළාත් සභාවේ පොදු කටයුතු :**

කිසිවක් වාර්තා වී නැහැ.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

මේ යටතේ ගරු නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2016/08 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ආරාධනා කරනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

ගරු සභාපතිතුමනි ඒ යෝජනාව අද දවසේ ගේන කොට නියඟය අද වනවිට පවතින්නේ නෑ. නමුත් ඒ පහුගිය කාලයේ අවුරුදු ගණනාවකට පස්සේ අපිට දැඩි නියඟයක් මුළු රටටම පැවතුණා. ඒවගේම අද දවස වෙන කොට වර්ෂාව පැවතුණාට ඒ නියගයෙන් විපතට පත් වූ ජනතාවට සහනයක් ලැබිලා නෑ. ඔවුන්ගේ අපනයන භෝග විශාල ප්‍රමාණයක් විනාශ වෙලා ගියා. ඒවගේම අනිකුත් ආර්ථික භෝග ඒවා විශාල ප්‍රමාණයක් විනාශ වෙලා ගියා. මේවා තුළ ඔවුන් කරන ලද වියදම් ඒවගේම ඔවුන්ගේ ආර්ථිකය කඩා වැටීම මහා බරපතල ලෙස සිද්ධ වෙලා තියෙනවා මේ නියන් තත්ත්වය නිසා. ඒ නිසා සමහර වකවානුවල මෙවන් තත්ත්වයන් ගංවතුරක් ආවහම ඒ ආධාර හානි වුණ අයට දෙනවා වගේම ගරු සභාපතිතුමනි පහුගිය කාල වකවානුවල මේ ආකාරයෙන් දීලා තියෙනවා නියන් ආධාර. ඒ නිසා මේ කටයුතු පිළිබඳව ඒ ලේකම් කාර්යාල මට්ටමින් හොයලා බලලා ඒ නියන් ආධාර , නියන් සහනාධාර ලබාදීමට කටයුතු කරනවා නම් මධ්‍යම රජය සමග යෝජනා කරලා කටයුතු කිරීම තමයි බලාපොරොත්තු වෙන්නේ මොකද මහා පීඩාවට පත් වුණ නිසා.

ඒවගේම මේකේ පහුගිය කාලයේ අපේ ප්‍රදේශවල ආසනවල අපි දැක්කා මහා ජල හිඟයක් තිබුණා. ඒ ජල හිඟයට ක්ෂණිකව විසඳුමක් ලබා දෙන්න පුළුවන්කමක් අපිට තිබුණේ නෑ. ඒ ප්‍රාදේශීය සභාවල වතුර බවුසර් හැම එහෙකටම දීලා තිබුණා. ඒවගේම වතුර බෙදා හරින උපකරණ දීලා තිබුණා. නමුත් අපිට ඒ අවශ්‍ය සහනය මහජනතාවට ලබා දෙන්න පුළුවන්කමක් තිබුණේ නෑ. ප්‍රාදේශීය සභා ඡන්ද තියලා මහජන නියෝජිතයින් නැතිවීම නිසා වතුර බවුසරයකට අපේ වරකාපොල ප්‍රාදේශීය සභාව ගත්තහම ඒවගේම හැම ප්‍රාදේශීය සභාවකම මුදල් අය කරලා තමයි මේවා ලබා දුන්නේ. වතුර බවුසරයක් වරකාපොලට ලබා දුන්නේ ,වතුර බවුසරයක් රු.7000/- කට. නමුත් මහජන නියෝජිතයන් හිටියා නම් එහෙම ජනතාවට පීඩාවට පත් වෙන්නේ නැතුව අපිට ඒවා නොමිලයේ ගම්මාන වලට ලබා දෙන්නටපුළුවන්කම තිබුණා. ඉතිං ඒක අර නියඟය ඇති වුණා වගේම මේ පළාත්

පාලන ආයතන මැතිවරණ තියන්නේ නැතුව මහජන නියෝජිතයන් පත්

නොකිරීම මහා අපහසුතාවයකට ඒ ජනතාව පත් වුණා. එක පැත්තකින් ඒ නිසා වතුර බෙදා හැරීම විතරක් නෙමෙයි ඒ පළාත් පාලන ආයතන වලින් ඒ ගම්මාන වලට ඒවගේම පීඩාවට පත් වුණ ජනතාවට ලබා දෙන සහන අපිට ලබා දෙන්න පුළුවන්කමක් ලැබුණේ නෑ. ඒ නිසා දැඩි අවධානයට අපේ රටේ පළාත් පාලන ආයතන ගත්තොත් පහුගිය කාලයේ ගම් සභා කියලා තිබුණා. එතනින් එහාට රජ සමයේ පවා පළාත් පාලන ක්‍රමයක් එහෙමත් නැත්නම් නැත්නම් යාන්ත්‍රිය ප්‍රාදේශීය යාන්ත්‍රණයක් හැදිලා තිබුණා. ඒ යාන්ත්‍රණය අද අවුරුද්දකට වඩා වැඩි කාලයක් අද නැතිවීම අර ජනතාවට කබලෙන් ලිපට වැටුණා හා සමාන තත්ත්වයක් ඇති වුණා . පහුගිය කාලය තුළ. ඒ නිසා මේ තත්ත්වය දැඩි අවධානයට යොමු කරනවා . යොමු කරලා හැකි ඉක්මනින් මැතිවරණය තියලා ඒ ජනතාවට අවශ්‍ය සහනය ලබා දෙන්න පීඩාවට පත් වුණ ජනතාවට ඇති වුණා වගේම හෙට දවසේත් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා මේ තත්ත්වය දැඩි අවධානයට ලක් කරමින් අද වර්ෂාව තිබෙන නිසා මේ යෝජනාවේ වටිනාකමක් දකින්න නැතුව ඇති. නමුත් ඒ පීඩාවට පත් වුණ ජනතාවගේ ආර්ථිකය කඩා වැටිලා තියෙනවා. ඒ නිසා ඒ අයට සහනය ලබා දෙන්න කටයුතු කරන්න ඒ අවශ්‍ය ආයතන වලට අදාල මධ්‍යම රජයට දැනුම් දීලා ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිමින් අවස්ථාව ලබාදීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තූතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමනි උදයකාන්ත ගුණතිලක අපේ නියෝජ්‍ය සභාපතිතුමාගේ යෝජනාව අනුව දැන් නම් නියඟයක් නෑ කියලයි අපිට කියන්න තියෙන්නේ. නියන් කාලය වුණ පාඩුව සඳහා මං හිතන්නේ ප්‍රාදේශීය ලේකම්තුමා හෝ තුමිය හම්බ වුණා නම් ඒ ජනතාවට ඒ නියන් ආධාරය ලබාදීමේ කටයුත්ත කරන්න තිබුණා. ප්‍රාදේශීය මට්ටමින් අර ජල හිඟයට ප්‍රාදේශීය ලේකම්තුමියක් ඉන්නවා. පළාත් පාලන කොමසාරිස්වරයෙක් ඉන්නවා. පළාත් පාලන ඇමතිවරයෙක් ඉන්නවා. ප්‍රාදේශීය සභාව ප්‍රමාද වුණාට ඒ කටයුත්ත ප්‍රමාද නැතුව ලබා දෙන්න පුළුවන් කියන එකයි මගේ මතය.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

මහජන නියෝජිතයෙක්ගේ අවශ්‍යතාවය පළාත් පාලන ඇමතිවරයෙකුට එහෙම වුවමනාවක් නෑ.

එයාට වුවමනා ඡන්දය ගන්න. පළාත් පාලන ලේකම්වරු කටයුතු කරන්නේ චක්‍රලේඛණ අනුව තමුන්නාන්සේ කොයි විදිහට කතා කළත් වැඩක් නෑ. මහජනයා

ගැන හොයලා බලලා ඒ පිළිබඳව ඇහුන්කන් දීලා නැති නිසා තමයි ඔය විදිහට කතා කරන්නේ.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால ரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------

නෑ නෑ අපි ඇහුන්කන් දෙන්නේම නෑ. තමුන්නාන්සේලා තමයි ඔක්කෝම දෙන්නේ. කට වහනවා.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
------------------------------------------------------

මම සිරිපාල කිරිඇල්ල මැතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඒ වචනය ඉල්ලා අස් කර ගන්න කියලා. කට වහනවා කියන එක. ඔබතුමාට බෑ කතා කරන්න.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------

ගරු සභාපතිතුමනි අපි මේ කියන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු පත් කරන්න කියන මතයේ අපිත් ඉන්නවා.

ඒවා කළ යුතුයි. නමුත් මෙතන ප්‍රමාදයට විකල්පයක් වශයෙන් අපි කියන්නේ ගරු සභාපතිතුමනි ප්‍රාදේශීය ලේකම්තුමිය ඉන්නවා. තව නිළධාරීන් ඉන්නවා. පළාත් පාලන කොමසාරිස්තුමා ඉන්නවා. ඇමතිවරයෙක් ඉන්නවා. මේ හරහා කෙරෙන්න ඕනේ. ඊට වඩා ප්‍රශ්න වුණා. චන්ද්‍රිකා කුමාරතුංග මැතිණිය කාලයේ අවුරුද්දයි මාස තුනක් වහලා තිබ්බා. ප්‍රාදේශීය සභා තිබුණේ නෑ. පළාත් සභාව තිබුණේ නෑ අවුරුද්දයි මාස ගාණක්. ඒ නිසා ඒවා උලුප්පලා කතා කරන එක අපි කියන්නේ ගරු සභාපතිතුමනි. (ඝෝෂාව) මේවා ගරු සභාපතිතුමනි මගේ කතාවෙන් පස්සේ කතා කරන්න කියන්න. ගරු සභාපතිතුමනි නියන් ආධාර දෙන්න කියන ඒවා අපිට කවුරුවත් උගන්වන්න ඕනේ නෑ. ගරු සභාපතිතුමනි ඔබතුමාට මතක ඇති 2004

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------

මොන්ටිසෝරි යන්න.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------

මොන්ටිසෝරි තමුන්නාන්සේ යන්න. අපි නෙමෙයි යන්න ඕනේ. අපි දන්නවා මොන්ටිසෝරි යන්න ඕන බව.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

තමුන්නාන්සේ මූලාසනයට කතා කරන්න.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
-----------------------------------------------------

උප සභාපති මූලාසනයට නැග්ගහම කතා කරන විදිහෙන් එයා තමයි මොන්ටිසෝරි යන්න ඕනේ. ගරු සභාපතිතුමනි මොන්ටිසෝරි යන්න ඕනේ එයා. එහෙම නැත්නම් මේ පුටුවේ ඉඳගන්න කොට දැන ගෙන ඉඳගන්න ඕනේ. මෙයා උපසභාපති.

ගරු සභාපතිතුමනි දැන් මේ නියන් ආධාර, විවිධ ආධාර ඒ කරුණු කාරණා ගත්තහම ගරු සභාපතිතුමනි අමුතුවෙන් කියන්න වුවමනාවක් නෑ ආණ්ඩුවට. මෙතුමා දන්නවා 2004 ගංවතුර,සුළි සුළං,නාය යෑම් දිස්ත්‍රික්ක පහක සිද්ධ වුණා. ඒ දිස්ත්‍රික්ක පහක සිද්ධ වෙන කොට අද අපේ අගමැතිතුමා එදා අගමැති 2004. එතුමා පූර්ණ හානි ලක්ෂයක් දුන්නා. ඉතිහාසයේ රන් අකුරෙන් ලියවෙන විදිහට ඊට කලින් දීලා තිබුණේ පූර්ණ හානි කීයද. රු.10000/- යි. රු.12500/- යි. රු.15000/- යි. අර්ධ හානි ඒවා රු.5000/- යි. රු.7500/- යි. 2004 නාය යෑම් දිස්ත්‍රික්ක පහක සිද්ධ වෙන කොට ගංවතුර එන කොට සුළි සුළං එන කොට එවකට හිටපු අගමැති, අදත් අපේ අගමැති අනිල්

වික්‍රමසිංහ මැතිතුමාගේ කාලයේ. පූර්ණ හානි ලක්ෂයක් කළේ එතුමා. එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා පූර්ණ හානි ලක්ෂයක් අර්ධ හානි හතළිස්දාහක් දුන්නා නම් නියන් සහනාධාර දෙන ඒ අසරණ ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන නායකයෙක් ගරු සභාපතිතුමනි. මේ මඩ ගහන්න. ආවට ගියාට කතා කරන්න ආවට සභාවේ සභාපති පුටුවේ වාඩි වෙන්න කතා කරන්න ඉගෙන ගෙන ඉඳගන්නට ඕනේ. මොන්ටිසෝරි යන්න ඕනේ එයා ගරු සභාපතිතුමනි. එසේ කියමින් ගරු සභාපතිතුමනි මේ නියන් සහනාධාර සඳහා දැන නම් නියඟයක් නෑ. දැන් ගං වතුර තියෙන්නේ. නියඟය යන කොට ගංවතුර, ගංවතුර යන කොට නියඟය. මේ සියල්ලම ගත්තහම රජයෙන් දෙන්න ඕනේ සහනාධාර. උපරිමය ලබා දෙන බව සහතික වෙමින් ගරු සභාපතිතුමනි මම නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තූතියි ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*
-----------------------------------------------------

සභාපති පුටුවේ වගේම විපක්ෂ සංවිධායක පුටුවේ වාඩි වෙන කොටත් එහෙම වෙන්න ඕනේ මං හිතන්නේ.

(සෝෂාව)

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***

*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

සභාව නිශ්ශබ්ද වෙන්න. සිරිපාල මන්ත්‍රීතුමා වාඩි වෙන්න. නියෝජ්‍ය සභාපතිතුමා ඔබතුමා වාඩි වෙන්න. මීළගට ගරු අකිල සාලිය එල්ලාවල මන්ත්‍රීතුමා. හරි සිරිපාල මන්ත්‍රීතුමා. අකිල මන්ත්‍රීතුමා ඔබතුමා කතා කරන්න.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
*Hon. Member Akila Ellawala*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ යෝජනාව ස්ථිර කරමින් තමයි මම මේ සාකච්ඡාවට එළඹෙන්නේ. මේ අවස්ථාවෙදී එතුමා ප්‍රකාශ කළ ආකාරයට දැනට නියන් තත්ත්වයක් නොතිබුණත් නමුත් සුළු අපනයන භෝග සම්බන්ධයෙන් අද රටේ ජනතාව බොහෝ පීඩාවට පත් වෙලා ඉන්නේ. මං සමහර විට මාතෘකාවෙන් පොඩ්ඩක් පිට ගිහින් කතා කරන්නේ. නමුත් සුළු අපනයන භෝග කේන්ද්‍රස්ථාන වෙලා තියෙන හින්දා මම ඒ පිළිබඳව තමයි විශේෂයෙන් අවධානය යොමු කරන්නේ. සුළු අපනයන භෝග ගත්තොත් එහෙම රත්නපුර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් මේ 2002 කෘෂි කරමාන්තයේ සංඛ්‍යා ලේඛණ වලට අනුව හෙක්ටයාර් 10739 ක් වගා කරලා තියෙනවා. කෑගල්ල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 8545 ක් වගා කරලා තියෙනවා. අද ගත්තොත් එහෙම වශයෙන් අපිට මතකයි 2014 ට පෙර දෙසැම්බර් 31 වෙනිදා දක්වා උදාහරණයක් ගත්තොත් ගම්මිරිස් ,කුරුඳු වගේ සුළු අපනයන භෝගවල පැළ නොමිලයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු වෙන් ලබා දුන්නා. ඊට අමතරව ඒ සඳහා උපදෙස් ලබා දුන්නා. ඊට අමතරව අවශ්‍ය ණය මුදල් ලබා ගැනීමට හැකියාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා ලබා දුන්නා. නමුත් කියන්න කණගාටුයි ගිය වසරේ නොවැම්බර් 17 වෙනිදා වෙන කොට අපිට දැන ගන්න ලැබුණා මේ සියළුම පොත් වසා දමලා කිසිම සහනයක් අඩුම ගානේ ගම්මිරිස් පැළයක්වත්,කුරුඳු පැළයක්වත් ඒ දෙපාර්තමේන්තුව හරහා ලබාදීමට රජය තහනම් කෙරුවා. මේක ඉතාමත් කණගාටුදායක අවස්ථාවක්. අපි දන්නවා ලෝකය ගත්තොත් එහෙම කුරුඳු අපනයනය කරන රටවල් ගත්තොත් එහෙම ලංකාව තමයි ලෝකයේ විශාලතම කුරුඳු අපනයනය කරන ප්‍රධාන රට බවට පත් වෙන්නේ. නමුත් කුරුඳු නිෂ්පාදකයින්ට නැත්නම් ගොවියන්ට රජයෙන් ලබා දෙන දිරිමත් කිරීමේ වැඩ සටහන් නැත්නම් සහන ලබාදීමේ වැඩ සටහන් ඉතාමත් අල්ප වශයෙන් තමයි සිද්ධ වෙන්නේ. ඉතාමත් කණගාටුදායක අවස්ථාවක් මට මතකයි ගිය අවුරුද්දේ පුද්ගලයින් කීප දෙනෙක් මට චෝදනා කළා. අක්කර ගණන් ශුද්ධ පවිත්‍ර කරලා එළි පෙහෙලි කරලා වර්ෂාපතනයත් එක්ක පැළ හිටවන්න ඕනේ කියන අධිෂ්ඨානයෙන් නොවැම්බර් මාසය වෙන කොට තමන්ගේ වගුරු බිම් ශුද්ධ කරලා ඉඩම් ශුද්ධ කරලා ලැස්ති වුණා ගම්මිරිස් පැළ දාන්න. කුරුඳු පැළ දාන්න. මම රත්නපුර දිස්ත්‍රික්කයට ආවේනික දේවල්

සුළු අපනයන භෝග කුඩා හා මධ්‍ය පරිමාණයේ නිෂ්පාදකයින්ට බොහෝම කනස්සල්ලට ලක් වෙන්න හේතු වෙලා තියෙනවා. එක හේතුවක් තමයි එදා දුන්නු සහන අද ඒ සහන එකක්වත් ලැබෙන්නේ නෑ නිෂ්පාදකයින්ට. උදාහරණයක් වැඩියෙන් කතා කරන්නේ. නමුත් අවාසනාවකට වගේ මම ඉස්සෙල්ලා කිව්වා වගේ නොවැම්බර් මාසයේ පොත් වැසීම තුළින් ඒ මිනිස්සුන්ට කිසිම භෝගයක් වගා කරන්න බැරි වුණා. අදත් ඒ ඉඩම් ශුද්ධ පවිත්‍ර කරලා විතරයි

තියෙන්නේ. නමුත් කිසිම පැළයක් හිටවීමේ හැකියාවක් නෑ. ඉතිං මේවා සුළු අපනයන භෝග ඒවා විතරක් නෙමෙයි අද බුලත් තියෙනවා. අපිට ආවේනික වෙච්චි කිතුල් පැණි මේවාත් සුළු අපනයන භෝග තමයි. නමුත් අපි දන්නවා අපේ කෘෂිකර්ම අමාත්‍යවරයා ජේඨිය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා කියනවා. වී නිෂ්පාදනය අඩු කරන්න. හෙක්ටයාර් එක්ලක්ෂ දහ දාහක් වී නිෂ්පාදනය නොකර මුං ඇටයි ඉරිඟුයි වගා කරන්න කියලා. ඉතිං මේ වගේ අපේ රට වගේ කෘෂිකර්මයෙන් යැපෙන රටක අපේ කෘෂිකර්ම ඇමතිවරයා මේ වගේ වගකීමකින් මාධ්‍යයට ඇවිල්ලා මේවගේ ප්‍රකාශයක් කිරීම මං හිතන්නේ කෘෂිකර්ම සම්බන්ධ සියළුම ගොවියන් අධර්යමත් කරන සටහනක් හැටියටත් මට පේන්නේ. නමුත් රත්නපුර දිස්ත්‍රික්කය කෑගල්ල දිස්ත්‍රික්කය වගේ දිස්ත්‍රික්කවල අපි ජීවත් වෙන්නේ විශේෂයෙන් කෘෂිකර්මය සම්බන්ධවයි. කෘෂි කර්මාන්තය සම්බන්ධවයි අපේ ජීවිත ගැටිලා තියෙන්නේ. ඊළඟට මැණික් ව්‍යාපාරය. අද මැණික් කර්මාන්තය එහෙන් පිටින්ම කඩා වැටිලා. මැණික් කර්මාන්තයත් ගන්න පුළුවන් අපනයන භෝග හැටියට . අපනයන භාණ්ඩ හැටියට. නමුත් මේ සියළුම අපනයන භෝගත් කර්මාන්ත සුළු කර්මාන්ත හැටියට අපිට ආවේනික සියළුම කර්මාන්ත අද කඩා වැටිලා. මේකට හේතුව ගැන කතා කරන්න ගියොත් එහෙම සමහර කට්ටිය අධර්යමත් වෙයි. නැත්නම් අසතුටු වෙයි. සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා ප්‍රාදේශීය ලේකම්තුමා හම්බ වුණා නම් මේ නියන් ආධාර වලට සහනයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. නැත්නම් ගංවතුරට

අහු වුණොත් එහෙම සහනයක් ලබා ගන්න පුළුවන් කියලා. මං දන්නේ නෑ ඒ ප්‍රාදේශීය ලේකම්වරු ඉන්නේ කොහේද කියලා. නමුත් අපේ පැත්තට ඒවාට ගොදුරු වෙච්ච කට්ටිය ගිහිල්ලා ප්‍රාදේශීය ලේකම්තුමා හම්බ වුණහම ප්‍රාදේශීය ලේකම්තුමා කියනවා එතුමාට එහෙම මුදලක් නෑ. ඒ සඳහා ලබා දෙන්න කියලා. ඒ හානි වෙච්ච භෝග සඳහා. ඉතිං මේක මං දන්නේ නෑ ඔබතුමා කොහේද ප්‍රාදේශීය ලේකම්තුමාට කතා කරන්නේ. නමුත් අපේ පැතිවල නම් අපිත් ජීවත් වෙන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ. අපේ ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ගාව නම් ඔන්න ඔය උත්තරය තමයි දුන්නේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි මේ අපේ උපසභාපතිතුමා ගෙනාපු යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක්. නමුත් කාලගුණය කියන එක දවසින් දවස වෙනස් වෙනවා. ඔබතුමාමයි මේ යෝජනාව ගෙනාවේ. දැනට මාසයකට විතර ඉස්සෙල්ලා. ඒ අවස්ථාවේ තිබුණ තත්ත්වය අනිවාර්යයෙන්ම ඒ සුළු අපනයන භෝග වගාකරුවන්ටත් අනිවාර්යයෙන්ම සහනයක් ලබා දිය යුතුයි. එහෙම නැති වුණොත් එහෙම ඒ ගොවි මහත්තුරුන් ඒ කර්මාන්තයෙන් ඉවත් වෙනවා. කර්මාන්තයෙන් ඉවත් වෙනවා කියන එක ඉතාමත් භයානකයි. මොකද විරැකියාවට තවත් පුද්ගලයින් දහස් ගාණක් විරැකියා ලැයිස්තුවට එකතු වෙනවා. විරැකියා වැඩි වෙන්න වැඩි වෙන්න නැත්නම් ස්වයං රැකියා නැති වෙන්න නැති වෙන්න මේ රටේ තිබෙන අපරාද ප්‍රමාණය වැඩි වෙනවා. මෙන්න මේවා තමයි අපි සලකා බලන්න ඕනේ. අපි ගොවි මහත්තුරු දිරිමත් කරන්නේ නැත්නම් ඔන්න ඔය තත්ත්වය ඉතාමත් ඉක්මනින් උදා වෙනවා කියන එක වැඩි කල් යන්න ඉස්සෙල්ලා අපිට දැක

බලා ගන්න පුළුවන් වෙයි. ඒ නිසා මේ ගරු උපසභාපතිතුමාගේ යෝජනාව අනිවාර්යයෙන් කාලෝචිත යෝජනාවක් ලෙස සලකමින් මට කාලය ලබාදීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ගරු අකිල සාලිය එල්ලාවල මන්ත්‍රීතුමනි. මීළඟට අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ නියෝජ්‍ය සභාපතිතුමා ගෙනාපු යෝජනාව එතුමාම කියපු පරිදි දැනට මාස කීපයකට පෙර ආවා නම් ඉතා වටිනවා. වර්තමානය වෙන කොට හොඳට වර්ෂාව ලැබෙනවා. නමුත් ඒ අවස්ථාවේදී නියඟයෙන් හානියට පත් උදවිය පිළිබඳව සොයා බලලා ඒකට වන්දි මුදලක් ලබා දෙනවා නම් ඉතාම වටිනවා කියන එක අපිත් ප්‍රකාශ කරනවා. ඒ එක්කම එතුමා වැදගත් යෝජනාවක් කරන ගමන් අර ප්‍රාදේශීය සභාවත් ඒකට පූට්ටු කර ගත්ත එක ගැන තමයි අපිට තියෙන ප්‍රශ්නය. මොකද ප්‍රාදේශීය සභාවෙන් මම හිතන්නේ නෑ කිසිම කලෙක ගොවිතැනක් සඳහා වතුර අඩුපාඩු තිබ්බයි කියලා එහෙම ලබා දෙනවා කියලා. යෝජනාවේ තියෙන්නේ නියඟය නිසා හානියට පත් ජනතාව වෙනුවෙන් ගොවීන් සහ පානීය ජලය වෙනුවෙන් ආධාරයක් කිරීම කියලා මේකේ තිබුණා නම් ඔබතුමාගේ ඒ යෝජනාවයි ඒ කතාවයි බොහොම සාධාරණයි කියන එක අපි පිළිගන්නවා.

හැබැයි ප්‍රාදේශීය සභාව මේ වෙන කොට අපි දන්නවා මේ පළාත් සභාවේ ප්‍රධාන ඇමතිතුමා යටතේ තමයි තියෙන්නේ. ප්‍රාදේශීය සභාවට සංවර්ධනයට මුදල් එනවා ඒවා කවුරුවත් ඇඟිල් ගහන්නේ නෑ ප්‍රධාන ඇමතිතුමා තමයි ලේකම්වරු ගෙනල්ලා මේ පාර හදන්න මේක කරන්න මේක කරන්න කියලා නියෝග දෙන්නේ. ඒක කාගෙන්වත් ආණ්ඩුවක් තිබ්බා කියලා ආණ්ඩු පක්ෂයෙන් බලපෑමක්වත් නැහැ. ඒවාට ගිහිල්ලා කිසිම ප්‍රශ්නයකුත් නෑ. ඒවගේම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ වරිය ඇතුළු කණ්ඩායම පත් කරලා තියෙනවා තීන්දු තීරණ . ඒ කණ්ඩායම තීරණය කරලා තමයි ඕනේ නම් සහනයක් දෙන්න මුදලට දෙන්න ඒ තීන්දු ගන්න. ඒ නිසා අක්‍රිය වෙලා නෑ. ඒවා ක්‍රියාත්මකව තිබෙනවා. අපි යවන යෝජනාවත් එතන ක්‍රියාත්මක වෙනවා. අර ජනතාව එකතු වෙලා ජනතාව අදහස් ප්‍රකාශ කිරීම සිද්ධ වෙන්නේ නෑ. ඒක වැරදියි. ඒක අඩුපාඩුවක්. ඒක අපිත් පිළිගන්නවා. දෙපැත්තටම බෙදිලා මැතිවරණයක් ඉක්මනින් තිබ්බොත් අපි තමයි පත් වෙන්නේ. ඒක දැක්කානේ ඉදිරියේදී. දෙපැත්තට වෙලා. ඔබතුමන්ලාම සාක්ෂි දරයි. මොනවද මේ පපුවේ පැත්තෙන් තියෙන හඬ කියලා එහෙම. ඒ නිසා අපිට පැහැදිලිවම කියන්න පුළුවන් ප්‍රාදේශීය සභා මැතිවරණය ඉක්මන් වෙන තරමට එක්සත් ජාතික පක්ෂය කැමතියි. මොකද ඔය තියෙන ප්‍රාදේශීය සභා 100% ක්ම එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහනය කරන්නේ. ඒක පැහැදිලිවම පේනවා මොකද අද තියෙන තත්ත්වයත් එක්ක. අපි ඒකට කැමති නෑ. තමුන්නාන්ස්ලාගේ බෙදීම ගැන. එකතු වෙලා ඉන්නවා නම් හොඳයි. නමුත් එහෙම වෙනවා. ඒක නිසා තමුන්නාන්සේලාට වැඩිය මේ ප්‍රාදේශීය සභා මැතිවරණය එනවා නම් හෙට අනිද්දාම මේ කවල් එක ලෙහෙන්න ඉස්සෙල්ලා එනවා නම් අපි ඒකට

කැමතියි. ඒක නිසා ඒකට කිසිම තර්කයක් නෑ. ඒක මේ වැස්සට පැවිල්ලට පූට්ටු කර ගන්නට අවශ්‍ය නෑ. ඒ නිසා තමුන්නාන්සේලාට අපි කියන්නේ අපේ අකිල එල්ලාවල මන්ත්‍රීතුමාත් හොඳ අදහස් ටිකක් කිව්වා ඇත්තටම. අපේ පැත්තෙන් ගත්තහම වැලිගෙපොල,කල්තොට, මැදබැද්ද දිහාව ,ඇඹිලිපිටිය පැත්ත,කොලොන්න පැත්ත විශාල වශයෙන් ගම්මිරිස් සොයන ප්‍රදේශයක් බවට පත් වෙලා තියෙනවා. අක්කර ගණන් ලක්ෂ ගණන් කොලොන්න දිහාවේ බදු දෙන්නේ ගම්මිරිස් කඩා ගන්න. අද ඒ පහුගිය කාලයේ ඒ වගාව සම්පූර්ණයෙන්ම අක්‍රිය වුණා. ඒවගේම තේ වගාව අක්‍රිය වුණා. එතුමා කතා කරපු අර මැණික් වලට නම් පායලා තිබිච්ච එක හොඳයි. මොකද ගඟට බැහැලා පහසුවෙන් ගරා ගන්න පුළුවන් නිසා. ඒක මේකට පූට්ටු කර ගන්නටත් ටිකක් අපහසුයි. මොකද මම කල්පනා කළා මේකට එකතු කර ගන්නේ කොහොමද කියලා. කොහොම හරි ඒ ස්ථාන ගැන අධ්‍යයනයක් කරලා ඒ අයට සහනයක් ලබලා දෙන්න මධ්‍යම ආණ්ඩුවට යෝජනා කරන ගමන් අපේ පළාත් සභාවේත් කෘෂිකර්ම අමාත්‍යාංශයට පුළුවන්කමක් තියෙනවා නම් ශ්‍රීලාල් ඇමතිතුමනි යම්කිසි සහනයක් දෙන්න පුළුවන් නම් ඉතාම වටිනවා.

ඒ එක්කම කෘෂි කර්මාන්තය පිළිබඳව රටේ ඇති වෙලා තියෙන දියුණුව මොකක් හරි පසුගමනක් හරි තියෙනවා

කාලයේ නොමිලයේ ඇට දුන්නා නම් නොමිලයේ පැළ දුන්නා නම් ශක්තිමත් වෙලා තියෙන්නට ඕනේ. හැබැයි ඒවා එච්චර සාර්ථක වුණේ නෑ. ඒවා අසාර්ථක වුණා. ඒවා අපිට පැහැදිලිවම පෙනුණා. ඒක නිසා ඒ අසාර්ථකත්වය තුළ සිද්ධ වුණා කෘෂි කර්මාන්තය කරන මනුස්සයෙකුට වහන්න සිද්ධ වුණා. දැන් අද දන්නවා අපි රංජිත් බණ්ඩාර ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් ස්වයං රැකියා වලට ආධාර දෙනවා. හැබැයි අපි ඒ මැෂිම අරන් ගිහිල්ලා දෑවැද්දට දෙන්න ගෙදර මුල්ලක තිබ්බොත් ඒ මහන මැෂින් එකෙන් ස්වයං රැකියාව සිද්ධ වෙන්නේ නෑ. අද එදා ඉඳලා ගත්තොත් එහෙම කෘෂි කර්මාන්තයට දීලා තියෙන භෝග ටික ගත්තහම අපේ ගෙවල්වල,අපේ ඉඩම්වල අපේ ගොවි මහත්තුරුන්ට දුන්නා නම් විශාල සංවර්ධනයක් සිද්ධ වෙනවා. හැබැයි නිකන් දෙන ගම්මිරිස් පැළ ටික ගිහිල්ලා තමන්ගේ මිදුලේ ගම්මිරිස් ඇටේ හැදෙනකන් ගම්මිරිස් ටික තියාගෙන ඉන්නවා. මොකද අවශ්‍ය කරන මිනිහාට නෙමෙයි ඒක දුන්නේ. තමුන්නාන්සේ සමීක්ෂණයක් කරලා බැලුවොත් දිවි නැගුම වැඩ සටහන යටතේ හොඳ වැඩ සටහනක්. ඒ යටතේ කොච්චර ආධාර දෙනවාද. අද සමහර ගෙවල්වල ඒවා තාම කාඩ්බෝඩ් පෙට්ටියේ සීල් එක කඩන්නේ නැතුව වතුර පොම්බ තියෙන තැන් තියෙනවා. කාඩ්බෝඩ් පෙට්ටියේ සීල් එක කඩන්නේ නැතුව මහන මැෂින් තියෙන තැන් තියෙනවා. ඒවගේම පිටි අඹරන මැෂින් තියෙනවා. තාම ගෙවල්වල කිසිම ප්‍රයෝජනයකට ගන්නේ

නම් ඒ පිළිබඳව ඕනම විවාදයකට එන්න ලෑස්තියි එක්කම අවශ්‍ය තොරතුරුත් එක්ක ඒ කෘෂි කර්මාන්තයේ දියුණුව රජයේ දක්වන සහයෝගයත් එක්ක මොකක්ද කියන එක අපි කියන්නේ. ඒවගේම තමුනනාන්සේලාත් කිව්වා පසුගිය රජය කාලයේ නොමිලයේ පැළ දුන්නා ඇට දුන්නා මේ කෘෂි කර්මාන්තය ශක්තිමත් කරන්න කියලා . හැබැයි ඒ

නැතුව. හැබැයි මේ වැඩේ කරන මනුස්සයාට දෙන්න ඕනේ. කෘෂි කර්මාන්තය කරන මනුස්සයාට මේක දෙන්න ඕනේ. අපිට ඕන මනුස්සයාට දීලා හරියන්නේ නෑ. අන්න ඒක තමයි වර්තමානයේ කරන්නේ. යම්කිසි මුදලක් ඒ වෙනුවෙන් වියදම් කරන්නේ ඒකට කැක්කුම තියෙන මනුස්සයා. ඒ අයට සහයෝගයක් දක්වනවා. ඒ අයට

අවශ්‍ය කරන මාර්ග පෙන්වීම කරනවා. මම දන්නවා අපේ කෘෂිකර්ම ඇමතිතුමා කෘෂිකර්ම ඇමතිතුමාට උපදෙස් ලැබිලා තියෙනවා කෘෂි කර්මාන්තයෙන් ජීවනෝපාය ගැට ගහගෙන යන මනුස්සයාගේ ගම්මාන වලට පාරවල් ටික සකස් කරලා දෙන්න කියලා. එතුමාට ප්‍රජා ශාලා හදලා දෙන්න පුළුවන්. ඒගොල්ලන්ට ලයිට් දෙන්න පුළුවන්. ඒ යටිතල පහසුකම් ටික ශක්තිමත් කළොත් අන්න ඒගොල්ලන්ගේ නිෂ්පාදනයට යන පිරිවැය අඩු කරන්නට පුළුවන් වෙනවා. අන්න ඒ නිසා එවැනි වැඩ පිළිවෙලකට යන්නට වෙනවා. තමුන්නාන්සේලාට අවශ්‍ය නම් මේ පිළිබඳව විවාදයකට එන්න අපි කැමතියි අපේ පැත්තේ ඉඳගෙන ඒ විවාදයකට සාධරණයක් ඉෂ්ට කරලා දෙන්න අවශ්‍ය කරන කරුණු එකතු කරන්න. ඒ නිසා මේ යෝජනාව අපි අනුමත කරනවා. ඒවගේම මේ යෝජනාවෙන් හානියට පත් වෙච්චි පිරිස් හොයලා බලලා ඒ අයට යම්කිසි සහනයක් ලබා දෙමින් ඉතාමත් අත්‍යාවශ්‍ය වෙනවා. ඒ කටයුත්ත එලෙස කෙරෙන්න ඉඩ තිබෙද්දී ඒකට සහයෝගය දක්වද්දී අනිත් ප්‍රශ්න හුවාදක්වපුවා පිළිබඳව වෙනම විවාද වලට එනවා නම් වෙනම යෝජනා වලට එනවා නම් අපි ඒකට එකතු වෙලා කටයුතු කරමුයි කියලා ඒකට සම්බන්ධ වෙනවා කියන එක පැහැදිලිවම කියන්නට ඕනේ.

කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

බොහොම ස්තූතියි ගරු අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමනි. මීළඟට ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ උදයකාන්ත නියෝජ්‍ය සභාපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අපිට වාර කීපයකදී ගන්නට බැරි වුණා සභාවේදී. එතුමා නියෝජනය කරන කෑගල්ල ප්‍රදේශයේ ඉතාමත් ඉහළ කඳුකර ප්‍රදේශ. ඒවගේම අපේ රත්නපුර ප්‍රදේශයේත් ඉහළ කඳුකර ප්‍රදේශවල බහුලව කෘෂි කර්මාන්තය මූලික කරගෙන තමයි අපේ ජනතාව ජීවත් වෙන්නේ. විශේෂයෙන් කුරුඳු, ගම්මිරිස් ,වී ඇතුළු බහු වාර්ෂික භෝග හා සුළු අපනයන භෝග වලින්

ඒක නිසා නියඟය ප්‍රාදේශීය සභා මැතිවරණයටවත් එහෙම නැත්නම් ලංකාවේ කෘෂි කර්මාන්තය දියුණුවීමෙන් පසුව කිහ එකටවත් පූට්ටු කරන්නේ නැතුව වෙනම ගන්නේ නැතුව ඒක ලඝු කරන්නේ නැතුව අපි කෘෂි කර්මයේ නියැලෙච්චි නියඟය නිසා හානි වෙච්ච විපතට පත් වෙච්චි ඒ උදවිය පිළිබඳ යම්කිසි සහනයක් දෙන එකට සම්පූර්ණයෙන් එකඟත්වය එළ කරනවා

තමයි අපේ ප්‍රදේශයේ තේ,රබර් එක්කලා යැපුණේ. පහුගිය නියඟය තිබුණ සමයේ ඇත්තටම විශාල ඉඩම් ප්‍රමාණයකට හානි ආවා. ඒ පැළ මට්ටමේ තිබිච්චි වගා කරපුවා ගොඩක් භෝග වලට ඒ නියඟය විශාල ලෙස බලපෑවා. ඒ අනුව ඒ අවස්ථාවේදී නියඟය නියා ගොවි ජනතාවගේ ගොවිතැන් පාළු වුණා හා සමානවම ජන ජීවිතයත් විශාල ලෙස හානියට පත්වුණා. මිනිස්සුන්ට බොන්න

වතුර නැති වුණා. ඒ බොන්න වතුර නැති වෙන කොට ඒ වතුර ලබාදීමේ වැඩ පිළිවෙල නොයෙකුත් ආකාරයේ සිද්ධ වුණා. හැබැයි ඒක භෝග වලට වතුර දාන්න ඉස්සෙල්ලා ජීවත්වීම සඳහා වතුර දැමීම තමයි පළමුව කළ යුතුව තිබුණේ. උදයකාන්ත මන්ත්‍රීතුමා යෝජනා කළේ ඇත්තෙන්ම ප්‍රාදේශීය සභාව තිබුණා නම් ප්‍රාදේශීය සභාවට අපි දීපු අපේ වතුර බවුසර් තිබුණා අපිට ඒවා පාවිච්චි කරලා අපේ ජන ජීවිතයේ අවුලක්ව පැවතිච්ච නියඟය කාල සීමාවේදී අපිට වතුර බෙදන්න පුළුවන්කම තිබුණා. අපිට මේ ඇහැලියගොඩ ආසනයේත් අපේ ප්‍රදේශවල වතුර නැති වෙච්චි නියඟය ඇති වෙච්ච පහුගිය මාස කීපය තුළ ප්‍රාදේශීය සභාව මැදිහත් වෙලා මට මතකයි අපේ ප්‍රාදේශීය සභාවේ වතුර බවුසර් අරගෙන ජලය දුන්නා. මේක ඇත්තටම දේශපාලන කාරණාවක් නෙමෙයි. මේක නියඟයද වැස්සද ජනතාවට පීඩාවක් වෙන කොයි අවධියේදීද ජනතාව වෙනුවෙන් මේ ආණ්ඩුව ,පළාත් සභාව ,ප්‍රාදේශීය සභාව සහ වගකිව යුතු ආයතන කටයුතු කිරීම ඒ අයගේ තිබෙන්නා වූ කාරණාවක්.

ඒ නිසා මේ පහුගිය කාලයේදී ඇති වුණ නියඟයේදී ඊට අවශ්‍ය නියන් සහනාධාර ඒවගේම ඒ හානි වුණු වගාවන්ට අවශ්‍ය සහන ලැබුන් නැති බවයි අපි දන්න හැටියට කරුණු කාරණා හොයලා බැලුවහම ඒ සහන දීලා නෑ. ඒ

නිසා අපි කරුණාකරලා මේ රජයට කියන්නේ එවැනි හානියට පත්වුණ ඉඩම් වහාම හොයලා ඒවායේ වාර්තාවල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, ගොවිජන සේවා එකේ තිබෙනවා. ග්‍රාම නිළධාරීවරුන්ට මතක් කරලා තිබෙනවා. කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිළධාරීවරුන් මතක් කරලා තිබෙනවා. ඒ අය ළඟ වාර්තාවල් තිබෙනවා. ඒ වාර්තාවල් වලට අදාල ඒ අයට වුණ හානියට යම් සහනයක් ලබා දෙන්න කියන කාරණාව තමයි අපි කියන්නේ. එහෙම වුණොත් ජනතාවට සහන සලසනවා. හැබැයි මේ ආණ්ඩුව අපි දන්නේ නෑ අපිට සහන ලබාදීම එන්න එන්න අඩු කරලා තියෙනවා. මේ ආණ්ඩුව සුභ සාධනවාදී භාවයකින් තොරව තමයි කටයුතු කරන්න කියන කාරණාව තමයි අපිට කියන්නේ. දැන් මේ පහුගිය කාලයේ නියන් තත්ත්වය ඇති වුණ කාලයේදී ඒ අයට සහනාධාරය ලබා දුන්නේ නැත්නම් මේ ආණ්ඩුව සහන ලබාදීම එන්න එන්න කප්පාදු කරලා තියෙනවා. අපිට බය හිතෙනවා සමෘධි සහනාධාරයක් ඉස්සරහට කප්පාදු වෙයිද කියලා. සැකයක් අපිට තියෙනවා. පහුගිය කාලයේදී මේ රටේ ජනතාවට පනවන බදු බර දිහා බැලුවහම. ලැබිච්චි බදු බර අද ජනතාවට ලබා ගන්න බැරුව ඉන්නවා. එක පැත්තකින් මේ ස්වභාවික ව්‍යවසන ඇවිල්ලා ගංවුර නියඟය වගේ තත්ත්වයන් ඇවිල්ලා ජනතාවට ඒ පැත්තෙන් පීඩන එන කොට ආණ්ඩුවක් හැටියට සාමාන්‍ය ජනතාවට ගොවි ජනතාවට බලපාන ආකාරයේ ජනතාව ගොඩ නැගීමේ බද්ද වැට් බද්ද මේවා වැඩි කරලා ජනතාව එනන එන්නම පීඩාවට පත් කිරීම ජනතාව, ගොවියා,සාමාන්‍ය ජනතාවට ලොකු අසාධාරණයක් මේ ආණ්ඩුව මගින් සිද්ධ වෙන බව අපිට පේනවා.

ඒ නිසා අපි පැහැදිලිවම කියන්නේ සුභ සාධනය කප්පාදු කරන්න එපා. ඒ අයගේ සුභ සාධනය ලබා දිය යුතුයි. ඒවගේම හානියක් වුණා නම් ඒ හානියට ඒ ලබාදිය යුතු සහනය ලබා දිය යුතුයි. ඒ නිසා අපේ උදයකාන්ත ගුණතිලක අපේ නියෝජ්‍ය සභාපතිතුමා කිව්වේ සහන කප්පාදු කරන්නේ නැතුව විශේෂයෙන් අපේ මන්ත්‍රීවරු කිව්වා මැතිවරණ තියන්න බය නෑ කියලා. අපි පැහැදිලිවම කියනවා මැතිවරණ තියන්න බය නිසා තමයි මැතිවරණ එන්න එන්නම කල් දාන්නේ. ඒ නිසා අපිට මේ සුභ සාධනය සහ දේශපාලනය ගැන කාරණා

දෙකකටයි අපි කල්පනා කළ යුත්තේ. සුභ සාධනය මේ රටේ ජනතාට අවශ්‍යයි. අනිත් පැත්තෙන් ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරණ ක්‍රමයත් අපිට අවශ්‍යයි. දැන් ප්‍රාදේශීය සභා මැතිවරණය තියලා තිබ්බා නම් අර අහිංසක වතුර ටිකක් බොන්න නැති ජනතාවට අපේ මන්ත්‍රීතුමන්ලා ප්‍රාදේශීය සභාවේ මැදිහත් වෙලා ගිහිල්ලා වතුර බවුසර් දාලා අපේ ගම් වලට වතුර දෙන්න කටයුතු කළා. ඒවාට අපි මුදල් අය කළේ නෑ. ඒ නිසා අපි කියන්නේ මැතිවරණ තියන්න අපි ලෑස්තියි. පළාත් සභාව ඕනේ නම් සබරගමු පළාත් සභාව විසුරුවන්න ඕන වෙලාවක අපි ලෑස්තියි. ඕන වෙලාවක ඡන්ද වලට මුහුණ දෙන්න. අපි කියන්නේ ඒකයි. ඒ නිසා ප්‍රාදේශීය සභාව තියන්න බැරි නම් පළාත් සභාව තියන්න. අපි ඒවාටත් සූදානම්. හැබැයි අපි ඉදිරියේදී මැතිවරණයක් තිබ්බොච වෙලාවකදී නැවතත් මේ රටේ ජනතාවගේ අවශ්‍ය සුභසාධනය අවශ්‍ය බදු බර අඩු කරන ක්‍රමයකට ඉදිරියේදී අපි අවශ්‍ය කටයුතු කරන්න සූදානම් ජනතාව සැදී පැහැදී ඉන්න බව විශේෂයෙන් මතක් කරමින් අපේ උදයකාන්ත ගුණතිලක මන්ත්‍රීතුමාගේ යෝජනාවට අවශ්‍ය සහනය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින් ඒ යෝජනාව අනුමත කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තූතියි ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමනි. මීළඟට ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා. එතුමාසභාවේ නැහැ. මීළගට ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල මැතිතුමා.

***ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල***
***கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல***
*Hon.Member Ranjith Pollgampola*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ නියෝජ්‍ය සභාපති උදයකාන්ත මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සඳහා මටත් අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

ඔබතුමා දන්නවා විශේෂයෙන් කෑගලු දිස්ත්‍රික්කයේ දුෂ්කරම ආසනය කියන්නේ දැරණියගල ආසනය. දරණියගල ආසනය කියන්නේ ගරු සභාපතිතුමනි වර්ග කිලෝමීටර් 354 ක් තියෙන ආසනයක්. ඒ ආසනයේ ප්‍රධාන ආර්ථිකය වන්නේ තේ සහ රබර්. ඉතිං අපේ උදයකාන්ත මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අනුව අපේ පදේශයේ ජනතාවගේ ආර්ථිකය රඳා පවතින්නේ තේ සහ රබර් මත. මේ ගිය වර්ෂයේ ජනවාරි,පෙබරවාරි,මාර්තුවල පැවිල්ල තුළින් අපේ තේ වගා කරන ගොවීන්ට විශාල ලෙස හානි සිද්ධ වුණා ඉතිං එතුමා ගෙනාපු යෝජනාව අනුව ඒ හානි වෙච්චි තේ වගා මහතුන්ට යම් ආධාරයක් ලබා දීලා ඒ ආර්ථිකය ශක්තිමත් කරන්න කරනවා නම් ඉතාමත් හොඳයි. ඉතිං ඒවගේම අපේ කෘෂිකර්ම ඇමතිතුමා මේ අවස්ථාවේ ඉන්නවා. නමුත් ගම්මිරිස් වගාව වගේ අනිකුත් සුළු භෝග වලට පැහැදිලිවම හානි සිද්ධ වුණා නම් මම පැහැදිලිවම දන්නවා ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් මේ වනවිට හානි වුණා ගම් ගම්මිරිස් වගාවන් ඒ හැම වගාවන්ට පැළ ලබා දෙනවා හිටවන්න. තේ වගාවේත් එහෙමයි. තේ සංවර්ධන අධිකාරියෙන් තේ වගාවට ඒ පැළ මැරිච්ච ඒවාට පැළ ලබාදීම සිදු වෙනවා.

ඒ නිසා ඉදිරියේදී අපි සියළු දෙනාම එකතු වෙලා මේ අවස්ථාවේ අපි

යෝජනා කරනවා රජයට සහ වගාවන් හානි වෙච්ච හැම කෙනෙකුටම ආධාර ලබා දෙන්න කටයුතු කරන ලෙස කතා කරමින් ඒවගේම අපේ දැරණියගල ප්‍රාදේශීය සභාවේ නියඟය ආව හැම අවස්ථාවකම වතුර දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඒ ප්‍රාදේශීය සභාවේ ගලි බවුසර් ප්‍රයෝජනයට අරගෙන ජනතාවට වතුර බෙදා දීමක් සිදු කළා. මං හිතන්නේ අපේ මන්ත්‍රීතුමා දන්නේ නෑ මුදල් අය කිරීමක් කරේ නෑ. ඒ පුළුවන් ආකාරයට ඒ සේවය සැපයුවා. එහෙම නම් අපි සියළු දෙනාම එකතු වෙලා මේ උදයකාන්ත මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට අපි යෝජනා කරමු ආධාරයක් ලබා දීලා ඒ ගොවි ජනතාව ශක්තිමත් කරන්න මේ අවස්ථාවක් කර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් එතුමා ගෙනාපු යෝජනාවට අපේ සහයෝගය ලබා දෙමින් ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තූතියි ගරු රංජිත් පොල්ගම්පොල මැතිතුමනි. මීළගට ගරු යෙහෙයියා එම්. ඉෆ්ලාර් මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

-----------------------------------------

ගරු සභාපතිතුමනි ප්‍රථමයෙන්ම අවස්ථාව සලසා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. නියෝජ්‍ය සභාපතිතුමා වන උදයකානත් ගුණතිලක මැතිතුමා විසින් ගෙන එන ලද පවතින අධික නියන් තත්ත්වය හේතුවෙන් සුළු අපනයන භෝග බහු වාර්ෂික භෝග ඇතුළු වගාවන් රාශියක් හානියට පත්වී තිබීම. ගරු සභාපතිතුමනි මේ කාල වකවානුව ගත්තහම හානියට පත්වීම සම්බන්ධයෙන් සහ නියන් කාලය කියන එක වෙනස් වෙලා දැන් වර්ෂාපතනය ලැබිලා සියළු දෙනාට යමක් යහපතක් වෙන යුගයක් කාල පරිච්ඡේදයක් තමයි ඉදිරියේදී අපි සියළු දෙනාට දකින්න ලැබෙන්නේ. ඒ එක්කම අපේ උදයකාන්ත ගරු මන්ත්‍රීතුමා දේශපාලන කතන්දරයක් එක්ක විශාල පළාත් පාලන ආයතන ඒවගේම පළාත් පාලන ආයතන හරහා ලබා දෙන දේවල් ඒවගේ මේ පිළිබඳ තියෙන බලය සම්බන්ධයෙන් කතා කළා. ඒ එක්කම මට ඉස්සෙල්ලා කථා කරපු නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමාත් මේ දේශපාලන කථාවක් සම්බන්ධයෙන් තමයි කථා කළේ. නමුත් ඇත්තටම ඔබතුමා කියන කථාව ඇත්ත. කථාවේ දී

කියපු දෙයක් තමයි දේශපාලන අධිකාරිය එදා ඒ පළාත් පාලන ආයතනවල හිටියා නම් යම් යම් දේවල්, අයථා කටයුතු, අයථා විදිහට ඒ ගම් ප්‍රදේශවලට දෙන්න තිබුණා කියලා. එහෙම දෙයක් නෑ. ඒ ඉන්න විදිහට සමහර නිළධාරීන්ට අයථා යෝජනා කරන්න පුළුවන් කමක් නෑ. උදයකාන්ත ගුණතිලක අපේ නියෝජ්‍ය සභාපතිතුමා දැනගෙන ඉන්න ඕන ඔබතුමාත් පළාත් පාලන ආයතනයක් නියෝජනය කරපු , ඒ වගේම මේ පළාත් සභාව වගේ ගෞරවනීය ආයතනයක, ගෞරවනීය තනතුරක් දරණ පුද්ගලයෙක්. අද මේ පළාත් පාලන ආයතන සියල්ල විසුරුවා හැරලා තියෙන්නේ නිළ කාලය අවසන් වුනාට පස්සේ. තමුන්නාන්සේලාගේ කාලයේ සීමා

නිර්ණයන් සහ ඒ වගේම පළාත් පාලන පනත සංශෝධනය කිරීම නිසා තමයි අද මේ මැතිවරණය පවත්වන්න බැරි වෙලා තියෙන්නේ. වෙන කිසියම් හේතුවක් නිසා නෙමෙයි, හොඳට මතක තියාගන්න ඕන පහුගිය රජය කාලයේ සම්මත කරගත්ත, ඒ වගේම පහුගිය කාලයේ පළාත් පාලන මැතිවරණ සංශෝධන පනත් කෙටුම්පත නිසා තමයි අද මේ මැතිවරණය පවත්වන්න බැරි වෙලා තියෙන්නේ. මේ කවුරු කෑ ගැහුවත් අපිත් උඩින් කැමතියි. 90% ක් පළාත් පාලන ආයතන අපට නෑ. ඊළඟ මැතිවරණය තිබ්බාම පළාත් පාලන ආයතන 90% ක බලය එන්නේ අපට. ඇයි අපි පළාත් පාලන මැතිවරණයේ ඡන්දය නොතියා ඉන්නේ ? අපට තියාගන්න විදිහකුත් නෑ. සීමා නිර්ණය අවසන් කරලා ඒ පනතේ හැටියට තමයි ඡන්දය පවත්වන්න වෙන්නේ.

ඒ වගේම ඔබතුමා කියපු අනෙක් එක තමයි, මම කියන්න කැමතියි ගරු සභාපතිතුමනි,

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*

-----------------------------------------------------------

සීමා නිර්ණය කලින් කරලා තිබුණා. නමුත් කියලා තිබුණා ඒ සීමා නිර්ණය පිළිගන්න බෑ. නැවතත් කරන්න ඕන කියලා. ඒක තමයි ඔය පටලවාගෙන යන්නේ. ඒක තමයි මැතිවරණවලට බයේ ඡන්දය කල් දැමීමේ වැඩ පිළිවෙල.

***ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය***
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய***
*Hon. Minister Bhanu Munipriya*

-----------------------------------------------------------

ඒකට නම් නමින්ද මන්ත්‍රීතුමා කියන කාරණය සත්‍ය නෑ මන්ත්‍රීතුමා. මම වුනත් උත්තරයක් දෙන්න සූදානම් ඒකට නම්. මොකද අපේම ඇමතිතුමා, මුස්තාෆා ඇමතිතුමා ගෙනල්ලා මේක පැහැදිලිව කිව්වා. දැන් බලන්න සභාපතිතුමා, කොට්ඨාශ නිර්ණය කිරීමේ විශාල වැරදි රාශියක් තිබෙනවා. බලන්ගොඩ ආසනයේ අකිල මන්ත්‍රීතුමාත් එකඟ වෙයි. බලන්ගොඩ ආසනයේ එක කොට්ඨාශයක් ගත්තාම ඒ කොට්ඨාශය සම්පූර්ණයෙන්ම 1500 ක් දෙමළ ජනතාව ජීවත් වෙනවා නම්.....

(ආණ්ඩු පක්ෂයෙන් සෝෂා)

අපි ඇත්තටම මුහුණ දෙන්න ඕන. මම මේ කියන්නේ එක්සත් ජාතික පක්ෂයේවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේවත් කාරණයක් නෙමෙයි. මේක අපි හදන්න ඕන මේ රටේ මැතිවරණ ක්‍රමයක්. අපි මේ රටේ පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයක් හදන්න ඕන. අපි පළාත් සභාවේ ක්‍රමයක් හදන්න ඕන. සමස්ත වැදගත් ජනතාවට උත්තරීතර පාර්ලිමේන්තුවේ වෙලා තියන දේ පේනවා. එතකොට සමස්ත ජනතාවගේ කැමැත්තට අපේ ආණ්ඩුව මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉන්නකොට මේක විවිධ ප්‍රශ්න ඇතුව සම්මත කරගත්ත පනත මේ. ඒක නිවැරදි කිරීමේ වැඩ සටහනක් තියෙන්නේ. ඒක ඇතුළේ කොට්ඨාශ නිර්ණය කිරීමේ නිවැරදිතාවයත් තියෙන්න පුළුවන්. හැබැයි බහු ආසන හා තනි ආසන සම්බන්ධයෙන් ගත්ත ඒවායේ දී විවිධ ප්‍රශ්න තියන බව සංවිධායකවරයා

වශයෙන් මම දන්නවා. ඒක නිසා ඒක නිවැරදි කරගන්නම ඕන. ඒ සඳහා යන කාලය සම්බන්ධයෙන් මුස්තාෆා ඇමතිතුමා අපි සියල්ල කැඳවලා අපිව දැනුවත් කළා. ඒක අනුව මේ අවුරුද්දේ ඉවර වෙනවා. ලබන අවුරුද්දේ ජනවාරි මාසේ මුල් සතිවල ඡන්දය තියන්න පුළුවන්. ඒකයි එතුමාගේ කාරණය. මම මේ ආණ්ඩු පක්ෂයේවත් මොකක්වත් නමෙයි. මේක මතක තියාගන්න. සමහර කොට්ඨාශ වර්ගීකරණය කළොත් ඒ කොට්ඨාශයකින් අපි කියමු දෙමළ ජනතාව 1500 ක් ඉන්නවා. සිංහල අය ඉන්නේ 1100 යි. සමහර තැන්වල 2800 ක් සිංහල අය ඉන්නවා. 1900 ක් ඉන්නවා මුස්ලිම් අය. 700 ක් ඉන්නවා දෙමළ අය. හැබැයි මෙහෙම ගියොත් කවදාවත් දෙමළ නායකයෙකුට ඒක නියෝජනය කරන්නම බෑ. සමහර තැන්වල කවදාවත් සිංහල කෙනෙකුට නියෝජනය කරන්න බෑ. ඒක ඉතාමත්ම සියුම්ව අරගෙන බලලා, භූගෝලීය වශයෙනුත් බලලා කරන්න ඕන වැඩක්. අපි හදිසියේ කළා. ඡන්දයකටත් යන්න ගියා. නමුත් මේ කාරණය නිවැරදි කිරීම සමස්ත රටේම ප්‍රශ්නය විසඳෙන විදිහටත් වෙන්න ඕන. ඒක නිසා මේ නිර්ණය කිරීම ඉතාම වැදගත් විතරක්

නෙමෙයි රටේ අනාගතයට බලපානවා. ඒ රටේ අනාගත ප්‍රශ්නය විසඳන්න මේක නිවැරදි වෙන්න ඕන. ඒකට කාලයක් ඕන.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ගරු සභාපතිතුමනි, මම මේක කියාගෙන යන්නේ අපේ ගරු ඇමතිතුමා නිවැරදි කළා වගේම මේ වරද කළේ කවුද ? තමුන්නාන්සේලාගේ කාලයේ මේක ගැසට් කරලා තිබුණා නම් අපි මේක ඡන්දය තියනවා. ගැසට් කළෙත් නෑ එදා. සීමා නිර්ණයත් අවසන් කළා නම් ඒ අදාළ විෂයය භාර ඇමතිවරයා නියමානුකූලව ගැසට් කරලා තිබුණා නම් කිසි කරදරයක් නැතුව මේ මැතිවරණය පවත්වන්න තිබුණා. ඒක කළේ නැත්තෙත් තමුන්නාන්සේලා.

***ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය***
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய***
*Hon. Minister Bhanu Munipriya*
-----------------------------------------------------------

ඉෆ්ලාර් මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ එහෙම කියන එක වැරදියි. ගැසට් කරලා තිබුණා. ඒක නිවැරදි කරන්න. ඒකත් තේරුම් ගන්න.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

තමුන්නාන්සේලාට ඕන ඕන විදිහට ඒ කාලයේ තිබ්බ විදිහට ඡන්දෙ තියන්න බෑ. ඒ වගේම එක එක්කෙනාට ඕන ඕන විදිහට දිනන්න ඕන විදිහට තියන්න බෑ. සමස්ත ජනතාවට මේ රටේ මැතිවරණ ක්‍රමයක් පවත්වලා, විශ්වාසනීයත්වයක් ඇති වෙන විදිහට, සියළුදෙනාට යහපතක් වෙන විදිහට, තමන්ගේ නියෝජිතයා නියමානුකූල විදිහට යැවීම තමයි බලාපොරොත්තු වෙන්නේ. ඒ කොහොම වුනත් පළාත්

පාලන මැතිවරණය ගැන මම මීට වැඩිය යන්නේ නෑ. මෙතුමා කිව්වා අර බවුසර් ගෙනල්ලා වතුර දෙන්න ලේකම්වරයාට ඒ කතන්දරය. මේකේ ඇත්තටම ගත්තාම කොමසාරිස්වරියක් අපේ ඉන්නවා. මේ පළාත් පාලන ආයතන සියල්ලේම අද සම්පූර්ණ බලතල පැවරිලා තියෙන්නේ අපේ පළාත් පාලන විෂයය භාර ඇමතිවරයා වශයෙන් ප්‍රධාන ඇමතිතුමාට. මෙතුමා කිව්වේ මේ පළාත් පාලන ආයතනවල නියං සහනාධාර දෙන්න විදිහක් නෑ. ඒ එක්කම යෝජනාවත් එක්ක කිව්වේ රු.7000 ක්, 8000 ක් යනවා එක බවුසරයක්. බවුසරයකට සල්ලි දෙන්න අවශ්‍යා වෙන්නේ නෑ. විෂයය භාර ඇමතිවරයා වශයෙන් පළාත් පාලන ඇමතිවරයා වශයෙන් ප්‍රධාන ඇමතිවරයා හිටියා. ඔබතුමා පළාත් සභා මන්ත්‍රීවරයෙක් මේවා දැනගෙන හිටියා නම්, පළාත් පාලන විෂයය භාර ඇමතිවරයා දැනුවත් කළා නම්, විෂයය භාර ඇමතිවරයාට පුළුවන් කමක් තිබුණා පළාත් පාලන සභාපතිවරයාට හෝ ඒ ලේකම්වරයාට හෝ ලේකම්වරියට උපදෙස් දෙන්න මේ අනුව ක්‍රියාත්මක කරන්න කියලා. ඒ නිසා අපි කොහොමත් විදේශ රටවලින් ගත්ත ණය පියවන්න මේ ආණ්ඩුවට සිද්ධ වෙලා තියනවා. ඒ වගේම තමයි සහනාධාර පමණක් දීලා රටක් ගොඩගන්න බෑ. අපි හැමෝම කියන දේ හොඳට තේරුම් ගන්න ඕන. මොන දේ දෙන්නත් භාණ්ඩාගාරය පිරවෙන්න ඕන. භාණ්ඩාගාරය පිරෙන්නේ කොහොමද ? බදු මුදල් වලින්. එහෙම නැතුව මේකට කවුරුවත් ගිහිල්ලා සල්ලි දාන්නේ නෑ. පිටින් ගෙනල්ලා දාන්නේ නෑ. මේකට සියළුදෙනාම තේරුම් ගන්න ඕන, අපි සහනාධාර දෙන්න සූදානම්. තව අවුරුද්දක් ඉවසන්න. මොකද තමුන්නාන්සේලාත් හරියට අර කිරුළපන ගිය කට්ටිය වගේමනේ. කිරුළපන කට්ටියක් ගියා, පාර වැරදිලා, මාර්ගය වැරදිලා ගියා. අපේ සභාපතිතුමා කල්පනා කරනවා ඇති කිරුළපන කිව්වාම. ඒකත් අපි කොහොම කිව්වත්, මොන දේ කිව්වත්, වැරදි පැත්තට ගිය අය කොටසක් ඉන්නවා. හරි පැත්තට ගිය අය තව කොටසක් ඉන්නවා. කොයි පැත්ත ගියත් අපි කියන්නේ ඒක අපට නෙමෙයිනේ අවශ්‍යාතාවය තියෙන්නේ. අපට තියෙන්නේ සැබෑ ජනතාවගේ හඬ නංවන

මේ වගේ නියං සහනාධාර දියයුතුයි. අහිංසක නැති බැරි දුප්පත් ගොවියා රැකගැනීම අපේ වගකීම. ඒ නිසා ඔවුන්ගේ මෙවැනි නියං ආධාර ලබාදීම ඕනෑම අවස්ථාවක සුදුසුයි කියන තත්ත්වයේ ඉන්න පුද්ගලයෙක් මම. ඒ එක්කම තමයි මෙතුමා අපේ නමින්ද මන්ත්‍රීතුමා කිව්වා වැට් බද්ද , ඒ වගේම ජාතිය ගොඩනැගීමේ බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්දක් මේගොල්ලන්ට යන්නේ නෑ. 2% ම තමයි තවමත් තියෙන්නේ. තමුන්නාන්සේලා පටවපු 2%. ඒ එක්කම හොඳට මතක තියාගන්න ඕන ජාතිය ගොඩගැනීමේ බද්ද ඒ විදිහට තිබුණත් වැට් බද්ද ඇති කළේ තමුන්නාන්සේලා ගත්ත ණය. ඒ වගේම පහුගිය රජයවල් කරපු වැරදි. ඒවා නිවැරදි කරන්න අපට විශාල ලෙස ණය දෙන්න, මේ මොහොතේ, ජනතාව යම් නෙකනෙකුට බලයක් දීලා තියෙනවා නම් ඒ අවුරුදු පහ තුළ ඒ අයට ඒ බලය නිසි අන්දමින් කටයුතු කරන්න අපි අවස්ථාව සළසා දෙන්න ඕන. ඒ අවුරුදු පහට පස්සේ තමුන්නාන්සේලා ඕන දෙයක් කථා කරන්න. කියන්න පුළුවන්. මේ තවම පටන් ගත්තා විතරයි. මාස පහයි, හතයි. මේ මාස පහෙන්, හතෙන් අවුරුදු 20 ක් තිස්සේ කරපු දේවල් එක පාරට වෙනස් කරන්න බෑ. ආශ්චර්ය කරන්න බෑ. මැජික් පෙන්වන්න බෑ. ඒ නිසා මේ රජය නිසි අන්දමින් වර්තමාන ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය, වර්තමාන ආණ්ඩුව, දෙමුහුනු ආණ්ඩුව මතක තියාගන්න මේ හයිබ්‍රිඩ් ආණ්ඩුව හරියට දේවල් ඉෂ්ඨ කරයි. ජනතාව විශාල විශ්වාසයක්

නුදුරු අනාගතයේ දී ඇති කරයි. ජනතාව පැහැදිලිවම කියයි මේ රටේ ජනතාව පැහැදිලිවම කියයි මේ අළුත් සංස්කෘතිය තුළ, අළුත් නිර්මාණය තුළ මේ රටේ ජනතාවට යහපතක් ඇති වෙලා, මේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් ඉටුවෙලා, මේ රටේ ජනතාවට අනාගතයේ දී ගෞරවාන්විත ශ්‍රී ලංකාවක්, අනුන්ගෙන් යැපෙන්නේ නැති ශ්‍රී ලංකාවක්, අපට මේ රට ණය බරින් තොර ශ්‍රී ලංකාවක්, ඒ වගේම දියුණු ශ්‍රී ලංකාවක් දකින්න හැම කෙනාම බලාපොරොත්තු වෙනවා. ඒ සිහිනය සැබෑ වේවා ! අවුරුදු 5 කට පස්සේ අපි සියළුදෙනාම බලාපොරොත්තුවෙන් ඉමු. ඒ වගේම නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේ පළාත් සභාව විසුරවලා තියන්න කිව්වා නම් අපි නම් උඩින් කැමතියි. පළාත් සභාව විසුරුවලා තිබ්බොත් අපට බලාගන්න පුළුවන් අපි කොයි පැත්තෙද ඉන්නේ. අපි කොහොමද ඉන්නේ. තමුන්නාන්සේලා කොයි පැත්තේ ද ඉන්නේ කියන එක බලාගන්න පුළුවන් බව ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබාදීම පිළිබඳව අනේක වාරයක් ස්තුතිවන්ත වෙමින්, මේ ශ්‍රී ලංකාව වැඩිකල් යන්න මත්තෙන් දියුණු රටක් බවට පරිවර්තනය වේව කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---------------------------------------------------------------

ස්තුතියි ! ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමනි. ඒක අපි මැතිවරණයෙන් පස්සේ බලමුකෝ. මීළඟට ගරු ආරියවංශ බාලසූරිය මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී බී.ආරියවංශ***
***கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ***
*Hon.Member B.Ariyawansha*

-------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. මේ යෝජනාව මීට මාස කීපයකට පෙර තමයි ඉදිරිපත් කරලා තිබුනේ. අද මේ සභාවේ මෙම යෝජනාව ගන්නා අවස්ථාවේ දී මමත් පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන්, ඒ වගේම කොලොන්න ප්‍රදේශයේ විශේෂයෙන්ම සුළු අපනයන භෝග මිළදී ගැනීමේ ව්‍යාපාරයක් පවත්වන පුද්ගලයෙක් වශයෙන්, ඒ වගේම මේ වගාව පිළිබඳව හොඳින් දන්නා පුද්ගලයෙක් වශයෙන් මේකට මේ යේජනාවට සම්බන්ධ වෙනවා. ඒ නිසා අපි දන්නවා පසුගිය නියං කාලය තුළ කොලොන්න ප්‍රදේශයේ, ඇඹිලිපිටිය ප්‍රදේශයේත් කුරුඳු, ගම්මිරිස් ඇතුළු ඒ සුළු අපනයන භෝග විශාල ප්‍රමාණයක් හානියට පත් වුනා. ගොවීන් විශාල අසරණතාවයකට පත් වුනා ඒ දවස්වල. අපි දැක්කා සමහර ඉඩම්වල අක්කර ගණන් මැරිලා ගියා. ඒවාට කිසිම ආධාර මුදලක් මේ වෙනකල් තිබුනේ නෑ. අපි දැක්කා කුඹුරු, කුරුඳු, ඒ වගේම තේ වගාව, ගම්මිරිස් වගාව ඒ වගේම විශේෂයෙන්ම මේවායේ මුදුන් මුලක් නොමැති ශාඛ වශයෙන් හඳුන්වන මේ සුළු අපනයන භෝග අධික නියගයට ඔරොත්තු දෙන්නේ නෑ. ඒ නිසා මේ වැලක් හෝ එහෙම නැත්නම් කුරුඳු පැලයක් හිටවාගෙන වසර දෙකක් ගියාට පස්සේ තමයි අස්වැන්න ගන්න වෙන්නේ. ඒ නිසා සමහර අය අක්කර කාල, භාගය තියන අය එයින් ජීවත් වුන අය අද ඉතාම අසරණ තත්ත්වයේ තමයි ජීවත් වෙන්නේ. එමනිසා මීට පෙර කථා කරපු අකිල එල්ලාවල මන්ත්‍රීතුමා සඳහන් කළා මේ වෙනකොට ඒ සුළු අපනයන භෝග සඳහා

ඒ පැල වර්ග ලබාදෙන්නේ නෑ කියලා. අපි සඳහන් කරන්න කැමතියි මේ වෙනකොට ගිය වර්ෂය වෙනකොට 2015 වර්ෂයේත් තේ පැල, ඒ වගේම ගම්මිරිස් පැල, කුරුඳු පැල නොමිලේ ලබාදීමේ වැඩ සටහන්, ඒ ආධාර වැඩ සටහන් දිගටම ක්‍රියාත්මක වුනා. ඒ වගේම තමයි අද මේ රටේ සුළු අපනයන භෝග සම්බන්ධයෙන් කථා කළොත් අද ගම්මිරිස් කිලෝ එකක් රු.1010/- ඉදලා 1450/- දක්වා මිළකට ගන්නවා. ලංකා ඉතිහාසයේ වැඩිම මිළකට කුරුඳු කිලෝ එකක් 1550/- ඉදලා 2100/- දක්වා මිළකට අද මිළ වෙනවා. ඒ වගේම කරාබුනැටි කිලෝ එකක් රු.1200/- යි. අද පැඟිරි කර්මාන්තය ගත්තොත් එදා පැඟිරි රු.1800/- ට තිබුනේ. අද පැඟිරි කිලෝ එකක් රු.10,000- දක්වා යනවා. එමනිසා මේ වෙනකොට ගිය වර්ෂයේ ඇඹිලිපිටිය ප්‍රදේශයේ, ඒ වගේම පනාමුර ප්‍රදේශයේ, ඒ වගේම කොලොන්න ප්‍රදේශයේ පැඟිරි අක්කර 200 ක්, 300 ක් වගා කරලා තියනවා මේ වෙනකොට. ඒ අයට පැඟිරි අක්කරයකට රු.30,000 ක මුදලක් ලබාදීලා තියනවා. එමනිසා මම අපේ

උදයකාන්ත නියෝජ්‍ය සභාපතිතුමා ගෙනාපු යෝජනාව ස්ථිර කරන ගමන්, අර පසුගිය කාලයේ හානි වුන ඒ වගා සඳහා රජයෙන් හෝ එහෙම නැත්නම් පළාත් සභාවෙන් හෝ යම් සහනාධාරයක් ලබාදීම සුදුසුයි කියන ගමන්, ඒ වගේම 1990 තමයි අපි දැක්කේ මේ සුළු අපනයන භෝග වැඩියෙන්ම ව්‍යාප්ත වුනේ එදා ජනසවිය වැඩ සටහන තුළ, රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ. එදා උපදෙස් ලබාදීලා, ඒ වගේම පැල වර්ග, ඇට වර්ග ලබාදීලා, ඒ වගේම ආධාර ලබාදීලා, ඒ වගේම ජනසවිය වගේ වැඩ සටහන් තුළින් ඉතාම අසරණතාවයට පත්වෙලා තිබුණ පවුල් නගාසිටුවන්න මේ සුළු අපනයන භෝග හඳුන්වා දීලා කටයුතු කළා. එදා ඉදලා විවිධ රජයන් මඟින් මේවාට උදව් උපකාර කරලා අද මේ තත්ත්වයට ගෙනාපු වගාව තමයි පසුගිය කාලවල ඒ නියගයෙන් හානි වුනේ. එමනිසා මම ගරු සභාපතිතුමනි, මෙතුමා ගෙනාපු යෝජනාව ස්ථිර කරන ගමන්, ඉදිරියේ දී ඒ අසරණතාවයට පත්වුන ගොවීන් සඳහා යම් සහනාධාරයක් ලබාදෙන්න කියලා ඉල්ලා සිටිමින්, මෙතුමාගේ යෝජනාව මම ස්ථිර කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතිය ගරු ආරියවංශ බාලසූරිය මන්ත්‍රීතුමනි. මීළඟට ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*

---

ගරු සභාපතිතුමනි, අපේ නියෝජ්‍ය සභාපතිතුමා ගෙනාපු යෝජනාව මේ නියගයෙන් හානි වුන ජනතාවට වන්දි ගෙවන්න කියන මේ යෝජනාව මමත් අනුමත කරනවා. මොකද කෑගලු දිස්ත්‍රික්කයේ ගම්මිරිස්, කුරුඳු, කරදමුංගු, සාදික්කා, කරාබු, පුවක්, කොකෝවා වැනි වගාවන් සුළු අපනයන භෝග වගාවන් ව්‍යාප්ත වෙලා තියනවා කෑගලු දිස්ත්‍රික්කය තුළ. ගම්මිරිස් හෙක්ටයාර් 2106 ක් වගේ ප්‍රමාණයක් අද වගා කරනවා. ඒ වගේම කුරුඳු හෙක්ටයාර 323 ක්, කෝපි 835 ක්, කරාබු හෙක්ටයාර 1524 ක්, පුවක් 1427 ක් මේ

වගේ විශාල වශයෙන් අද වගා කරනවා. මේ වගා කරන වගාකරුවන්ට 25% ත්, 50 % ත් අතර ප්‍රමාණයකට අද නියගයෙන් හානි සිදුවෙලා තියනවා. එහෙම නම් අපේ ගරු මන්ත්‍රීතුමා යෝජනා කරපු විදිහට ඒ නියගයෙන් හානි වුන වගාකරුවන්ට වන්දියක් ලබාදිය යුතුයි. ඒ නිසා එම යෝජනාව අපි අගය කරනවා. ඒ එක්කම මෙතුමාගේ කථාවත් එක්කම ආවා ප්‍රාදේශීය සභා මැතිවරණය ගැන කථා කළා. පහුගිය කාලයේ, පහුගිය ආණ්ඩුවෙන් ප්‍රාදේශීය සභා සීමා නිර්ණය කරලා ඉදිරිපත් කරලා තිබුණා. නමුත් ඒකපාක්ෂිකව බලයේ හිටපු සභාපතිවරු, මන්ත්‍රීවරු සමඟ එක්වෙලා තමයි ඒ සීමා නිර්ණයන් නිර්මාණය කළේ. ඒක විශාල අසාධාරණයක් හැටියට අපි පෙන්නුම් කළා. අපි ඒකට විරුද්ධ වුනා විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය. අපි කිව්වා මේකට එකඟ නෑ කියලා. ඒ වගේම පැහැදිලිවම කියන්න ඕන එක්සත් ජාතික පක්ෂය, අපේ පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා කිව්වා

ප්‍රාදේශීය සභා මැතිවරණ ඕනෑම වෙලාවක සූදානම්. මේක ඉක්මන් කරලා ඉවර කරන්න. තිබුණ පැරණි ක්‍රමයට හෝ නැත්නම් නව යෝජනාවට හෝ මැතිවරණයකට යන්න කැමතියි. ඉක්මන් කරලා අවසන් කරන්න කියලා අපි අපේ පක්ෂය හැටියට යෝජනා කරලා තිබුණා. ඒ නිසා වර්තමාන පළාත් පාලන ඇමතිතුමා පැහැදිලිවම කියනවා මේ සීමා නිර්ණයන් අවසන් කරලා, මේ වර්ෂය තුළ අවසන් කරලා ලබන වර්ෂය මුල ප්‍රාදේශීය සභාවට මැතිවරණයට ලබාදෙන්න කටයුතු කරනවා කියන එක එතුමා පැහැදිලිව ප්‍රකාශ කරලා තියනවා. ඉතින් අපට ඒකේ ඊට එහා යන්න පුළුවන් කමක් නෑ. වර්තමාන මධ්‍යම ආණ්ඩුවේ පළාත් පාලන ඇමතිවරයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙක්. ඔහු කථා කරනකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය මෙතන කථා කරන එක නෙමෙයි එහෙම නම් ඒ ඇමතිතුමාගෙන් අහන්න ඕන ඇයි

එහෙම කරන්නේ කියලා. ප්‍රමාදයට හේතු අහන්න ඕන. අද තියන විනාශයට ප්‍රාදේශීය සභාවෙන් ජනතාවට යම් සේවයක් නොවෙනවා නම්, එහි පාලනයක් නොවෙනවා නම් ඔබතුමා වහාම මේක අවසන් කරලා, මැතිවරණයකට මුහුණ දෙන්න කටයුතු කරන්න කියන එක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ යුතුකමක් තියනවා ඒ ඇමතිවරයාට යෝජනා කරලා කටයුතු අවසන් කරන්න.

ඒ එක්කම කෘෂිකර්ම ඇමතිවරයා හැටියට විවේචනයක් මෙතන සිදුවුනා. ඒකත් අපි පැහැදිලිවම කියන්න ඕන. කෘෂිකර්ම ඇමති අද රජයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්තුමා. එතුමා මේ වී වගාවට අකමැති නම් ඇත්ත වශයෙන්ම අද මෙතන සභාවේ කථා කරපු මන්ත්‍රීවරයාට පුළුවන් වෙනවා තමන්ගේ මහ ලේකම්තුමාගෙන් අහන්න ඔබතුමා

ඇයි මේ වගේ ප්‍රකාශයක් කළේ කියලා. ඇයි මෙහෙම දේවල් කරන්නේ ? අවශ්‍යතාවය, වී වගාව, කවුරුත් පිළිගන්න දෙයක්. තමුන්නාන්සේලා වගේ අපිත් පිළිගන්නවා. කෘෂිකර්මයෙන් ඉතා ඉහළින්ම තියන වගාව තමයි වී වගාව. අපි මේ රටේ අපේ ආර්ථිකය ශක්තිමත් කරන, විශේෂයෙන්ම විදේශ විනිමය ආරක්ෂා කරනවා, මේ ශ්‍රී ලංකාව තුළ වී වගාව සාර්ථකව කටයුතු කළොත් කියන එක අපි කවුරුත් පිළිගන්නවා. ඉතින් එහෙම අවස්ථාවක මේ වගේ ප්‍රධාන පෙළේ ඇමතිවරයෙක්, එහෙම නැත්නම් පක්ෂයේ මහ ලේකම්වරයා මේ වගේ යෝජනාවක් ගේනවා නම් තමුන්නාන්සේලාට පුළුවන් කමක් තියනවා ඒ ඇමතිතුමාගෙන් අහන්න, මේ අපෙන් නෙමෙයි. මේ සභාවෙන් නෙමෙයි. තමුන්නාන්සේලාට අහන්න පුළුවන් කමක් තියෙන්න ඕන.

ඒ වගේම පැහැදිලිවම උදයකාන්ත ගරු මන්ත්‍රීතුමා, අපේ උප සභාපතිතුමා මේ වෙනකොට මම සුළු අපනයන භෝග සම්බන්ධ වාර්තාවක් ලබාගන්න කටයුතු කළා. කෑගලු දිස්ත්‍රික්කයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් මම විමසීමක් කළා. මේ වෙනකොට මට පිළිතුරක් ෆැක්ස් මඟින් ලැබිලා තියනවා. වගාව සඳහා ආධාර 50% ක් ලබාදෙන්න කටයුතු කරනවා කියලා. ඒක අද දවසේ අපට දැන ගන්න ලැබුණ දෙයක්. ඒක විශේෂයෙන්ම මේ ප්‍රශ්නය ගෙනාපු උදයකන්ත මන්ත්‍රීතුමාගේ දැන ගැනීම පිණිස, ඒ වගේම මේ සභාව දැන ගැනීම පිණිස මම ප්‍රකාශ කර සිටිනවා. 50% ක් ආධාර මේ වෙනකොට දෙන්න කටයුතු කරනවා කියලා. ඒ නිසා අපි කවුරුත් බලාපොරොත්තු වෙන දේ මේ ආණ්ඩුවෙන් අමතක කරලා නෑ. පහුගිය රජයෙන් වුනත් ගෙනාපු යෝජනා යම් කාලයේ දැක්කේ නෑ. එහෙම නම් අපි අපේ රජය තුළින් යම් තීරණයක් අරගෙන තියනවා අපි යමක් දෙනවා නම්, ඒ දෙන්නේ අපි බලාපොරොත්තු වෙන ඉලක්කය කරා යන්න, සාර්ථකව ඒ කටයුත්ත කෙරෙන්න, ඒ විදිහේ වැඩ පිළිවෙලක් තමයි මේ රජය සකස් කරලා තියෙන්නේ කියන එක ප්‍රකාශ කරමින්, ඔබතුමාට අපට මේ අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

දෙයක් තියනවා නම්, මහජනතාවට යහපතක් නම්, ඒ වගේම මේ කෘෂි වගාව වගා කරන ජනතාවට වාසි සහගත දෙයක් නම් අපි ඒ දේ නතර කරන්න කටයුතු කරන්නේ නෑ. අපිත් ඒ දේ ලබාදෙන්න කටයුතු කරනවා කියන එක කියන්න ඕන. එහෙම නම් අපි කියනවා ඉදිරියේ දී මේ කෘෂිවගාව කරනකොට විහිළුවක් විදිහට නෙමෙයි හරියට යමක් කරන්න. අද අපි අදහස් කරලා තියන හැටියට, දිස්ත්‍රික්කයේ සුළු අපනයන වගාව දැනුවත් කරලා තියන විදිහට අක්කර 5 ක් දක්වා ඉඩමක් සඳහා වගාකරුවෙක් යම් වගාවක් කරනවා නම් ඒ අයට පැල ලබාදීම සඳහා 50% ක මුදලක් අය කරනවා කියන එක. තමුන්නාන්සේලා සමහරවිට කියයි අපි නොමිළේ දුන්නා කියලා. නමුත් ඒ නොමිළේ දුන්න ඒවායෙන් කිසිම වැඩක් වුනේ නෑ කියන එක අපි පැහැදිලිවම දන්නවා. පෝළිමේ එනවා. ඇමතිතුමන්ලා උත්සව තියනවා. උත්සව තියලා දෙනවා. වියදමක් කරනවා. නමුත් ඒ වියදමේ හැටියට අපි ප්‍රතිඵලයක් පහුගිය

***ගරු සභාපති කංචන ජයරත්න***
**கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன**
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තුතියි ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමනි. මීළඟට ගරු ජී.එම්.කරුණාපාල මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
**கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால**
*Hon.Member G.M.Karunapala*

---------------------------------------------

ගරු සභාපතිතුමනි, උදයකාන්ත ගරු නියෝජ්‍ය සභාපතිතුමා කාලීන වශයෙන් වැදගත් වුන යෝජනාවක් ගෙනාවා. විවිධ විදිහට මේක සාකච්ඡා වුනා. එය ඉතා වැදගත් කියලා මුලින්ම

කියනවා. හේතුව ඇස් පනාපිට පවතින සිද්ධාන්තයක්. අපේ අපනයන ක්ෂේත්‍රයේ තේ, පොල්, රබර්, කුරුඳු හා විවිධ නානාංශික භෝග හා වී වගාව. මසින් මස මේ වගා ව්‍යාපාරය ප්‍රමාණය කිට්ටු වෙනවා. දැන් තමුන්නාන්සේලා මේ ප්‍රධාන පාරේ එනකොට මීට කන්න දෙකකට උඩදී වගා කරලා තිබුණ වී වගා කුඹුරු අද පුරන් වෙලා. ඒ සමඟම තේ වගාව අත හැරලා. රබර් වගාව අත හැරලා. මේ නියම මිළකුත් නැති ප්‍රශ්නය විතරක් නෙමෙයි අපට පහුගිය රජයන් මඟින් ලබාදුන්න සහනාධාර දිගින් දිගටම කප්පාදු කරලා. දැන් මේකට ස්වභාවික හේතු පිළිබඳ කථා කළා අපේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. පායනකොට නියගය එනවා. වහිනකොට සෝදා පාළුව ඇති වෙනවා. දළු ටික කුණු වෙනවා. කිරි කපන්න විදිහක් නෑ. මේ දෙපැත්තම බලපාලා තියනවා. ඊයේ පෙරෙයිදා වුන සිද්ධාන්තවලින් ස්වභාව ධර්මයා

තනිකරම ආණ්ඩුවට එරෙහි වෙලා තියනවා. එක තැනක අලි හතර දෙනෙක් මැරිලා හෙණ වැදිලා. මේ වගේ ස්වභාවධර්මයා තනිකරම කණපිට. ඕක ඉතින්

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*
-----------------------------------------------

ඔබතුමාට බාධා කරනවා නෙමෙයි. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ මොකවත් වුනේ නෑ.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
----------------------------------------

බෞද්ධ සාහිත්‍යයේ හෝ බෞද්ධ දර්ශණයේ කියලා තියනවා යහපත් කාලවල දී ඇති වෙන සිද්ධාන්ත. ඒ හින්දා දහම් පාසල් ගියා ඔබතුමාත්. මාත් ගියා. නොගිය කෙනෙක් කථා කළා නම් මම හොඳ උත්තරයක් දෙනවා.

***ගරු ආ.ප.සංවිධායක හර්ෂ සියඹලාපිටිය***
***கௌரவ அரச.க.அமைப்பாளர் ஹர்ஷ சியம்பலாபிடிய***
*Hon.Gov.Whip Harsha Siyambalapitiya*
-----------------------------------------------------

එක දහම් පාසලටද ගියේ දෙන්නාම ?

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
----------------------------------------

එහෙම වුනා නම් පන්සල ඉවරයි. දෙකක ගිය නිසා යාන්තම් බේරිලා තියනවා. ඒ නිසා අපි කථා කළා දැන් දෙනවාලු විපක්ෂනායකතුමා කිව්වා දැන් 50% ක් සහනාධාර දෙනවාලු, දුර්වල වුන වගාවලට. ඔය මොකවත් අළුත් කෙහෙල්මල් අපට ඕන නෑ. වෙනසක් ඕනත් නෑ. දුන්න රු.350/- පොහොර මිටිය දෙන්න වී වගාවට. දුන්න 1500/- පොහොර මිටිය දෙන්න තේ වගා කරන අයට. දුන්න 1300/- පොහොර මිටිය දෙන්න රබර් ටිකට, පොල් ටිකට. අපි අනෙක් ටික කරගන්නම්. හොඳ මිළකුත් තිබුණා. නිෂ්පාදනයත් වැඩි වෙලා. මේ දැන් බොරු බෙර පදයක් ගහනවා හැමදාම දෙනවා දෙනවා කියලා. හැබැයි අවුරුද්දකුත් මාස ගාණක් ගියා සංවර්ධනය අතින් බෝක්කුවක් හැදුවෙත් නෑ. එක රබර් පැලයක් වැඩියෙන්

හිටවුනේ නෑ. ලංකාවේ. අපිත් මේවා එක්ක හැපෙන මිනිස්සු වශයෙන් අපි හොඳට දන්නවා. අළුත් අළුත් ක්‍රමවේද තමයි එක්කහු කරන්න හදන්නේ. ගම්මිරිස් අපේ අජිත් කුමාර මන්ත්‍රීතුමා දන්නවා ඒ පැතිවල හොඳට ගම්මිරිස් හැදෙනවා. මෙන්න මේකට පාලන මිළක් දාන්න හදනවා රු.800/- ක. එතකොට රු.2000/- ටත් අපි දුන්නා ගම්මිරිස් ඒ පළාත්වල අය. ඇයි මේ නොකෙරෙන දේවල් ? ඒ හින්දා අපි කියන්නේ අපට හොඳ බීජ ටිකක් දෙනවා නම්, එදා දුන්නා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවෙන්. අපට දුන්නා පැල නොමිළේ 50% ක සහනාධාරයක් ඕන නෑ. ඕන තරම් ගම්මිරිස් පැල දුන්නා. ඕන තරම් තේ පැල දුන්නා. ඕන තරම් පොල් පැල දුන්නා.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*
-------------------------------------------

දැනුත් දෙනවා.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
-----------------------------------------

දෙනවා කියනවා විතරයි. දීපු දෙයක් නම් නෑ. ඒක හින්දා මේ අපි කියන්නේ මේ අපේ රට කෘෂිකාර්මික රටක්.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*
-------------------------------------------

ඕන තරම් දෙනවා. මේ ලංකාවේ.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*
-----------------------------------------

මෙයාට ඕන අළුත් ලංකාවක්. තොප්පිය දාන ලංකාවක්. තොප්පිය ගලවලා බලන්න කරුණාකරලා. දැන් අපේ අපනයන ක්ෂේත්‍රයේ අපේ රට මූලික ආදායම පළවෙනි එක විදේශ රැකියා. ඊළඟට ඇඟලුම් ක්ෂේත්‍රය. ඊළඟට තමයි

අපනයන ක්ෂේත්‍රය. මේ අපනයන ක්ෂේත්‍රයේ කෘෂි නිෂ්පාදන අඩු වෙන්න, අඩු වෙන්න ජනයාගේ ජීවන තත්ත්වය පහළ වැටෙනවා. අන්න පෙරෙයිදා ඉදලා බේකරි කර්මාන්තයේ සෑම එකකම මිළ රුපියල් 5/- කින් වැඩි වුනා. මේවා අඩු කරලා දෙනවා කිව්වා. නෑ දුන්නේ. මේකෙන් මොකද වුනේ ? අපට ලැබෙන සහනාධාර අඩුවීම නිසා ආහාර නිෂ්පාදන ප්‍රමාණය අඩු වෙනවා. ඒ නිසාම අපි තිරිඟු පිටි භාවිතයට වැඩියෙන් යොමු වෙනවා. අන්න ඒක නිසා මේක තමයි රජයට ගන්න පුළුවන් ලාභය කියලා ඒකටත් කණකොකා හැඬුවා රුපියල් 5/- කින් වැඩි වුනා. බොරු නෙමෙයි මේවා.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*
-----------------------------------------------

ගරු මන්ත්‍රීතුමා බාධා කරනවා නෙමෙයි. හැබැයි ඒ කාලයේ කිව්වා පාන් කන අය ත්‍රස්තවාදියෝ කියලා.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*

---------------------------------------

පාන් ත්‍රස්තවාදියෝ කිව්වෙ නෑ. අපි දෙන්නා එක ඉස්කෝලේ ගියා නම් ඔය ප්‍රශ්නය මගෙන් අහන්නෙ නෑ. ඒ කියන්නේ අපේ ඉස්කෝලේ හොඳට ඉගැන්වුවා ඒ කාලේ. අපි අපේ රටේ වී සහ ආශ්‍රිත නිෂ්පාදනය වැඩි කරගත්තොතින් අපට තිරිඟු භාවිතය අවශ්‍ය වෙන්නේ නෑ. ඒකයි කිව්වේ.

මේ මහජන නියෝජිතයොයි, අදාළ නිළධාරීනුයි එකතු වෙලා සාකච්ඡා කරලා ප්‍රශ්නවලට විසඳුම් එක්කහු කිරීමේ වගකීම, ඒක නැති කලෙත් පළාත් පාලන මැතිවරණයේ කවුද ? තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. හැමදාම සීමා නිර්ණය කියනවා. හිඟන්නාගේ තුවාලය වගේ මේකේ මාතෘකාව මොකක්ද එතකොට, මෙන්න මේ සීමා නිර්ණය. ඒ අහිංසක මහජන නියෝජිතයින් විශාල සේවාවක් කළා. කෘෂි ප්‍රශ්න ගැන කථා කළා. පළාත් පාලන ආයතනයේ වීදි ලාම්පුව ගැන කථා කළා. කසළ ඉවත් කිරීම පිළිබඳ කථා කළා. ග්‍රාමීය පාරවල් ගැන කථා කළා. අද ඒ මොකවත් කථා කිරීමේ අයිතිය නෑ. ඒක හින්දා අපි බල කරන්නේ කැමති විදිහට මේ ඡන්දෙ තියන්න. අර අජිත් කුමාර මැද්දේගම මන්ත්‍රීතුමා කිව්වා දැන් ඕන වෙලාවක ලෑස්තියි කියලා

ත්‍රස්තවාදී කථාවක් කිව්වා නෙමෙයි. ඊට පස්සේ අපේ කෘෂිකර්ම ඇමතිතුමා පිළිබඳව කිව්වා. කෘෂිකර්ම ඇමති දුමින්ද දිසානායක මහත්මයාත් එක්ක මීට මාස දෙකකට උඩදී අපි විධායක සභාවේ සාකච්ඡා කරනකොට පළවෙනි මාතෘකාව ආවේ පළාත් පාලන මැතිවරණය තියෙන්නේ කවදාද ? ජනාධිපතිතුමා තමයි මූලාසනයේ හිටියේ. විෂයය භාර ඇමතිතුමා කිව්වා සීමා නිර්ණයට කාලයක් එනවා. එහෙම කියලත් දැන් මාස දෙකයි. මාස 6 යි ඉල්ලුවේ. ජනාධිපතිතුමා දැන් කියනවා ලබන අවුරුද්දේ කොහොම හරි ඡන්දෙ තියනවාලු. මාස කීයක් වෙලාද ? දැන් මේ ක්ෂේත්‍රයට අපේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා මේකට සම්බන්ධ නෑ. මේකට ගැට ගහන්න බෑ කියලා කිව්වා. පුළුවන්. මධ්‍යම ආණ්ඩුවේ, පළාත් සභාවේ, පාර්ලිමේන්තුවේ ප්‍රාදේශිය සභා මේ මහජන නියෝජිතයින් ඉන්න හින්දා තමයි නිළධාරීන්ට වැඩ නොකර බැරි තත්ත්වයක් ඇති වෙලා තියෙන්නේ. ඒකට තමයි සම්බන්ධීකරණ කමිටු තියන්නේ සෑම දිස්ත්‍රික්කයකම.

විවාදයකට. අපි අභියෝගය බාරගන්නවා. කෘෂිකර්ම ක්ෂේත්‍රය පිළිබඳ, අපනයන ක්ෂේත්‍රය පිළිබඳ අපි සාකච්ඡා කරන්න, වාද කරන්න අපි අභියෝගය භාර ගන්නවා. තමුන්නාන්සේලා මැදිහත් වෙලා යෝජනාව දාන්න අපි වගකීම භාරගන්නවා. එහෙම නම් අපි මේක බැහැර කරන්න බෑ. ඒකාබද්ධව මේ රටේ සංවර්ධනයේ දී සහ රටේ ප්‍රශ්න වෙනුවෙන් කථා කරන්න මහජන නියෝජිතයින්ගෙන් පිරුනු ආයතන තමයි ඒවා. ඒකේ අද දුර්වලකම් රාශියක් තියෙන්නේ, මහජන නියෝජිතයින්ට කථා කිරීමේ අයිතිවාසිකම් නැති කරලා, කවදාවත් මේ මැතිවරණ තියන්නේ නෑ. මේ මන්ත්‍රීතුමා කියනවා අපි හරි කැමතියිලු දෙගොල්ලෝ දෙකට වෙන් වෙලා ඉන්නවාට. ඒක පෙනෙයි ඡන්දයක් තියනකොට දෙකට වෙන් වෙච්ච අය කොහොම වෙයිද ? හැමදාම එක මතයේ ඉන්න අයට මොනවා වෙයිද කියලා ඉතා පැහැදිලි වෙයි. ඒක හින්දා ඒකට තව කල් තියනවා. එහෙනම් අපි කියන්නේ, දැන් මට තහංචි දාන්න බෑ සභාපතිතුමාට.

මොකද උදයකාන්ත මන්ත්‍රීතුමා කථා කරනකොට විපක්ෂයෙන් කිව්වා කෘෂිකර්ම ක්ෂේත්‍රය විතරක් කථා කරන්න කියලා. ඔක්කෝම අය කථා කළා. කිරුළපන ගැනත් කථා කළා. අපි නෙමෙයි ඔයාලාගේ පැත්තෙන්. උණ ගැනෙනවා එදා කිරුළපන සෙනඟ දැක්කාම. ඇතැම් අයට. එක ඇමතිවරයෙක් කියනවා ලැජ්ජා නැතුව මොකටද මේ හුන්ඩු කටේ තියන්නේ මැයි දිනය. බලය තියනකොට හැමදාම තියන්නේ ගෝල්ෆේස් එකේ. ඇයි එතකොට ඒ කෙහෙල්මල හැව්ලොක් එකේ තිබ්බේ. අපේ ප්‍රශ්නය ඕකයි තියෙන්නේ. බැරියෑ ඔය බලය පාවිච්චි කරලා, ආණ්ඩුවේ බස් ටික අඩුවෙන් අරගෙන මේක තියන්න තිබුණානේ. හුන්ඩු කටේ මොකටද තිබ්බේ කියලා තමුන්නාන්සේලාගේ කෙනෙක් ඇහුවේ. හැබැයි හුන්ඩු කටට විශාල ජන ගංගාවක්

එදා ගලපු නිසා තමයි ආණ්ඩුව අද විවිධ ප්‍රශ්නවල දී දණ ගහලා තියෙන්නේ. මේක මුළු ලංකාවටම පෙන්වනවා අපි. මුළු ලංකාවම වීදි බස්සවලා අපි පෙන්වනවා, මේ ආණ්ඩුව කරන කෙහෙල්මලක් නෑ, පෙන්වනවා විතරයි. මේ මාතෘකාවත් ඒකයි. අපි කියන්නේ අපරාදේ කෘෂිකර්ම අපනයන වැඩි කරන්න නම් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව දුන්න සහනාධාර දෙන්න.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

-----------------------------------------------------------

කිරුළපන ද ගියේ ?

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*

----------------------------------------

ඔයා මේ පිනට ආපු චාන්ස් එකක් ඇවිල්ලා තමයි හැමදාම මෙතෙන්ට එන්නේ. මොනවා වුනත් පච්කාරකම් කරන ගමන් පිනකුත් කරලා තියනවා. ඒක හින්දා අද අනෙක් ඔක්කෝම වැඩ කරගෙන මාතෘකා කථා කරන්න හැදුවාට අනෙක් අය පිළිගන්නේ නෑ අජිත් කුමාර මන්ත්‍රීතුමා. පෞද්ගලික කිසිම තරහක් නෑ. සීමා නිර්ණය ගැන කථා කරනවා. මේක හොඳ නැහැලු මේ රටට මේ පළාත් පාලන ක්‍රමය. මේ රටේ සියළුදෙනාට හොඳ වෙන දෙයක් කවදාවත් වෙලා නෑ, මොකක් හරි නරක පැත්තක් තියනවා. 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත්

සභා ස්ථාපිත කරනකොටත් ඕකට විරුද්ධ වුනා. නමුත් අද හොඳයි කියනවා. ඒ නිසා තමයි අපි කියන්නේ මේ සියළු ප්‍රශ්නවලට අහිංසක ගමේ ප්‍රශ්නවලට මැදිහත්කරුවා වන ප්‍රාදේශීය සභා නියෝජිතයාගේ ඒ අයිතිවාසිකම ලබාදෙන්න, ඡන්දය තියන්න. අන්න එහෙම බල කරනකොට කෘෂිකර්ම ක්ෂේත්‍රය දියුණු වෙයි. පොහොර ටික කපනකොට ඒකට පෙළපාලි ගිහිල්ලා විරුද්ධ වෙයි. ඒ සභා ඇතුළත කථා කරයි. ඒ නිසා මේ අපේ උප සභාපතිතුමා ගෙනාපු යෝජනාව ඉතා වැදගත්. දැන් කිව්වා සහනාධාර ගැන. සහනාධාර දුන්නා හැම ආණ්ඩුවකින්ම. හැබැයි ශත 5 ක් වත්, තුට්ටුවක්වත් තවම වගා ව්‍යාපාරවලට සහනාධාර නොදුන්න ඉතිහාසයේ අවුරුද්දකුත් මාස ගාණක් ගිය එකම ආණ්ඩුව මේ ආණ්ඩුව කියලා අපි කියනවා. ඔප්පු කරන්න පුළුවන් නම් කොහේද දීලා තියෙන්නේ කියලා. විපක්ෂනායකතුමාට කිසිම අයිතියක් නෑ මගේ කථාවට බාධා කරන්න. තමුන්නාන්සේලා කියපු බණ අපි හොඳට

අහගෙන හිටියා. ශත 5 ක් දීලා නෑ සහනාධාර. කපා හැරියා විතරයි. දැන් කියයි අද සතුටුදායක ආරංචියක් තියනවා කියලා. ඒකත් බොරු. ආයු කාලය තීරණය කරන්නේ මේවායේ ජනයා. දැන් ඊයේ පෙරෙයිදා අවුරුදු 22 ක තරුණයෙක් අකුණක් ගහලා මැරුනා. එයා බලාපොරොත්තු වෙන්න ඇති 80 ක් ඉන්න. 22 කින් මැරුනා.

(සභාවෙන් ඝෝෂා).

මේ ආණ්ඩුවෙන් මාස ගාණක් ගියා. කරපු දෙයක් නෑ කියලා ඉතා පැහැදිලිව කියන්න පුළුවන්.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

අවසන් කරන්න මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*
*கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால*
*Hon.Member G.M.Karunapala*
----------------------------------------------

ඒක හින්දා මම කාලය ගන්නෙ නෑ. ඉතා වැදගත් මාතෘකාවක්. අපේ රට කෘෂිකාර්මික රටක්. ප්‍රධාන ආහාරය බත්. එහෙම නම් බත් කෑමත් අඩු කරලා, මුං ඇට කෑමක් අඩු කරලා, ධාන්‍ය කෑමත් අඩු කරලා දැන් ඕනෑ ඇමරිකාව කියන විදිහට නටන්නට තිරිඟු පිටි භාවිතය වැඩි කරන්න. ඒක නිසා උදයකාන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාව හරහා අපි බල කරනවා, අපේ කෘෂිකර්ම ඇමතිතුමාට සොච්චම් මුදලක් හම්බ වෙන්නේ. මේ කෘෂිකර්ම ක්ෂේත්‍රය දියුණු කරන්න මදි. අපි බල කරනවා එහෙම නම් මේ යෝජනාව සමඟ මේ වෙනසක් ඇති කරන්න ආරම්භ කරපු මේ ආණ්ඩුවට ගොවියා වෙනුවෙන් හිතා මතා කෘෂිකර්මාන්තය දියුණු කිරීමට දීපු සහනාධාර ටික දෙන්න. වෙන මොකවත් අළුතෙන් ඕනෑ නෑ. මගේ කථාව හමාර කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ! ගරු කරුණාපාල මන්ත්‍රීතුමනි. අපි ස්තුතිවන්ත වෙනවා පක්ෂ විපක්ෂ ගරු මැති ඇමතිතුමන්ලා සියළුදෙනාටම. ගරු නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 6/1/2016/08 දරණ යෝජනාව පිළිබඳව පක්ෂව, විපක්ෂව සහ සුභවාදී, අසුභවාදී කරුණු පිළිබඳව සභාව තුළ සාකච්ඡා කරමින් මෙම යෝජනාව පිළිබඳව ඉතාම හොඳින් යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව. ඒ අනුව මෙම යෝජනාවේ දී මතුවෙච්ච කාරණා ඉදිරි කටයුතු කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාටත්, ඒ වගේම අමාත්‍යාංශ ලේකම්තුමාටත් දන්වා යැවීමට අපි කටයුතු කරනවා. මීළඟට සභාව කල් තැබීමේ යෝජනාව.

**සභාව කල් තැබීම :**

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*

---

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාව 2016 මැයි 24 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු සභානායකතුමනි.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා :**

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න***
***கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன***
*Hon.Member Salitha Karunaratne*

---

ගරු සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විදිහට මම ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නේ දහස් සංඛ්‍යාත වූ රාජ්‍ය සේවකයින්ට අදාළ කාරණාවක්. විශේෂයෙන් වෙනත් ආදායම් මාර්ග නැති මාසික වැටුප පමණක් ලබන හැමටම අදාළ කාරණාවක්. විශේෂයෙන් රාජ්‍ය සේවකයින් ඇතුළු මාසිකව වැටුප් ලබන අය තමුන්ගේ ජීවිකාව ගෙනයන්නේ මාසික වැටුපෙන්. තමුන්ගේ ආහාර පාන ලබා ගැනීම ඇතුළු අඹුදරුවන් රැකීම, විදුලි බිල් ගෙවන එක, ජල බිල් ගෙවන එක, ටෙලිෆෝන් බිල් ගෙවන එක, දැන් මේ වැට් බදු වැඩි කිරීමත් එක්ක ජීවන මට්ටමට ඔරොත්තු නොදෙන මට්ටමට ඇවිල්ලා. එහෙම එකේ තමුන්ගේ ජීවිතය ගෙනියන්නේ තමුන්ගේ මාසික වැටුපෙන්. අප්‍රේල් මාසේ මාසික වැටුප අප්‍රේල් 10 හම්බ වුනා. එතකොට මැයි මාසේ වැටුප ලැබෙන්නේ මැයි 20. මාසෙකුත් දවස් ගාණක් අප්‍රේල් මාසේ වැටුපෙන් ජීවත් වෙන්න වෙලා තියනවා. අද වෙනකොට අප්‍රේල් මාසේ ගත්ත වැටුප රජයේ සේවකයින් ළඟ නෑ. බරපතල ජීවන අර්බුදයකට මුහුණ දීලා තියෙන්නේ. ඊළඟ කාරණය ගරු සභාපතිතුමනි, මැයි මාසේ 21 කියන්නේ වෙසක් පොහොය දවස. 22 ඉරිදා නිවාඩු දවස. එතකොට 20 වැටුප ගත්තත් ඒකෙන් තමුන්ගේ ඕනෑ එපා කම් ටික කරගන්න ලයිට් බිල ගෙවන්න, ජල බිල ගෙවන්න, ටෙලිෆෝන් බිල ගෙවන්න විදිහක් නෑ. ලයිට් කපයි. වතුර ටික කපයි. දරුවන්ගේ පන්ති ගාස්තු ගෙවන්න. පාසල් බස් රථයේ ගාස්තු ගෙවන්න. මේවා බැරි වෙයි. බරපතල අර්බුදයකට ලක් වෙනවා. ඒ නිසා සභාපතිතුමනි, එය සබරගමුව පළාතේ රාජ්‍ය සේවකයින්ට අදාළ කාරණාවක් විදිහට මැයි මාසේ වැටුප 20 නෙමෙයි අඩුම ගානේ මැයි 18 වෙනිදාවත් දෙන්න කියලා අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්න කියලා මේ ගරු සභාවට යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ යෝජනාව ප්‍රධාන ලේකම්තුමා වෙත යොමු කිරීමට අපි කටයුතු කරනවා. ඒ අනුව නීත්‍යානුකූලව, විධිමත් ආකාරයට ඔබතුමා විසින් ගෙන එන ලද යෝජනාව සබරගමුව පළාතේ අපේ රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් කළහැකි ද කියන එක සොයා බලා ඒ අවශ්‍ය පියවර ගැනීම සඳහා යොමු කිරීමට කටයුතු කරනවා.

දැන් වේලාව පෙරවරු 11.54 යි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු

අවසන් වෙනවා. මෙම ගරු සභාව 2016 ක් වූ මැයි මස 24 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අත්/කළේ :
කංචන ජයරත්න,
සභාපති,
සබරගමුවපළාත් සභාව.

පාලිත නානායක්කාර,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2016 ක් වූ මැයි මස 27 වෙනි දින,
සබරගමුව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.